2021

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்திறன் அறிக்கை

Annual Performance Report



නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු
රාජ්‍ය අමාත්‍යාංශය

நகர அபிவிருத்தி, கழிவுப்பொருட்களை அகற்றுதல் மற்றும் சமுதாய துப்புரவேற்பாட்டு
அலுவல்கள் இராஜாங்க அமைச்சு

State Ministry of Urban Development, Waste Disposal and
Community Cleanliness



නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා
කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංක: 411

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2021

17 මහළ, සුහුරුපාය, සුභූතිපුර පාර, බත්තරමුල්ල
දුරකථන : 0112 864 770 /0112 866 447
ෆැක්ස් : 0112 887 909

විද්‍යුත් තැපෑල : info@smoud.gov.lk
වෙබ් අඩවිය : www.smoud.gov.lk

පටුන

පරිච්ඡේද **පිටුඅංක**

01. පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය..... 01-02

1.1 හැඳින්වීම.....01

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු.....01

1.3 සුවිශේෂී ප්‍රමුඛතා 01-02

1.4 සංවිධාන සටහන.....02

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු 02

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන.....02

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු.....02

අ) ව්‍යාපෘතියේ නම.....

ආ) දායක නියෝජිතායතනය.....

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම.....

ඈ) ව්‍යාපෘති කාල සීමාව.....

02. පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම.....03-22

2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක.....03-22

03. පරිච්ඡේදය

3. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය.....23-27

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය.....23

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....24

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය.....25

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්.....26

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය.....27

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය.....27

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.....27

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය.....27

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව.....27

04. පරිච්ඡේදය

4. කාර්යසාධන දර්ශක.....**28**

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව).....28

05. පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය.....**29-30**

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු.....29

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.....30

06. පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ.....**31**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.....31

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේද?.....31

6.3 මානව සම්පත් සංවර්ධනය.....31

07. පරිච්ඡේදය

7. අනුකූලතා වාර්තාව.....**32-36**

01. පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2020 අගෝස්තු මස 09 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවන ලදී. 2021 ජූලි මස 07 දින ප්‍රකාශයට පත් කළ අංක 2235/45 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසුව ඉන් පෙර නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති ආයතන හතරක් සහ දේශීය අරමුදල් ව්‍යාපෘති මෙම නව රාජ්‍ය අමාත්‍යාංශ විෂය පථය යටතට පත්විය.

නාගරික සංවර්ධනය, කසල කළමනාකරණය හා ප්‍රජා පවිත්‍රතාවය යන විෂයන්ට අදාළව "නවීන නගර හා සුපිරිසිදු රටක්" නිර්මාණය කිරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගේ මෙහෙයවීම හා මග පෙන්වීම යටතේ නියමිත නෛතික කරුණු, අණපනත් සහ ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන සහ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සහ අමාත්‍යාංශ විෂයපථය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනවල විෂයන් සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට හා කාර්යය ශ්‍රිතවලට අයත්වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ජනතාවගේ ආර්ථික හා ආධ්‍යාත්මික යහපැවැත්ම මෙන්ම ස්වභාවධර්මය සමග සුසංයෝගී වූ ප්‍රියමනාප දිවි පැවැත්මක් සහතික කරන තිරසර නාගරික ජීවිතයක්

මෙහෙවර

විශිෂ්ට නගර සැලසුම් හා ඉංජිනේරු නිපුණතා, අතිනවීන තාක්ෂණය සහ ලෝකයේ විශිෂ්ට භාවිතාවන් යොදා ගනිමින් රටේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථානවල මැනවින් සැලසුම් කරන ලද, හරිත, පවිත්‍ර සහ සුහුරු නාගරික ජනාවාස නිර්මාණය කිරීම තුළින් දේශයේ ආර්ථික සමෘද්ධිය සාක්ෂාත් කරගැනීම සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

අරමුණු

රාජ්‍ය අමාත්‍යාංශයේ මූලික අරමුණ වන්නේ ජන ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ මට්ටමකින් පවත්වා ගන්නා අතරම නාගරික ප්‍රදේශවල වාසය කරන ජනතාව රටේ සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේ කොටස්කරුවන් වන බවට සහතික කරන්නා වූ විධිමත් වෙනස්කම් සහ සංවර්ධන ක්‍රියාදාමයන් නාගරික ප්‍රජාව වෙත ගෙන ඒමය.

1.3 සුවිශේෂී ප්‍රමුඛතා

- පැල්පත් හා අඩු ආදායම්ලාභීන් සඳහා අංග සම්පූර්ණ නිවාස සංකීර්ණ සංවර්ධනය මඟින් නාගරික ශ්‍රම බලකාය සමාජීය වශයෙන් සවිබල ගැන්වීම
- කොළඹ හා නාගරික තදාසන්න ප්‍රදේශවල මැදි ආදායම්ලාභීන් සඳහා නවීන පහසුකම් සහිත නිවාස සංකීර්ණ සඳහා දිගුකාලීන ණය පහසුකම් සැපයීම
- ගංවතුර පාලනය, නාගරික රථගාල්, සාප්පු සංකීර්ණ, ශරීර සුවතා, විනෝදාශ්වාද පහසුකම් සැපයීම සහ පැරණි මහල් නිවාසනව මහල් නිවාස මගින් ප්‍රතිස්ථාපනය කිරීම
- නාගරික පැල්පත්වාසීන් සඳහා නාගරික නිවාස යෝජනා ක්‍රම හරහා නවීන නිවාස ලබා දීම හා ප්‍රජා පහසුකම් ලබා දීම

- මධ්‍යම පාන්තිකයින්ගේ නිවාස ගැටලු විසඳීම සඳහා නව නිවාස ව්‍යාපෘති හා ණය පහසුකම් සැලසීම
- කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම
- නිවාස ඉදිකිරීම් ආයතන සඳහා සහනදායී මිල යටතේ ඉඩම් ලබා දීම මඟින් නව නිවාස ව්‍යාපෘති සඳහා ආයෝජකයන් දිරිමත් කිරීම
- නාගරික වන උයන්, නාගරික හා අර්ධ නාගරික උද්‍යාන, ජල උද්‍යාන හා මාර්ග දෙපස හරිත මංතීරු හඳුන්වා දීම
- නාගරික අපද්‍රව්‍ය හා මලාපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ ජලය ප්‍රතිචක්‍රීකරණය සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම
- පළාත් පාලන ආයතන කිහිපයක් ඒකාබද්ධ වන පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගන සහ සනීපාරක්ෂක කසල රඳවනයන් ස්ථාපනය කොට අක්‍රමවත් කසල බැහැර කිරීම් වළක්වාලීමට කටයුතු සම්පාදනය කිරීම
- රෝහල් සහ කර්මාන්ත ශාලා අපද්‍රව්‍ය තාක්ෂණික සහ විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීමට අනුගත වන පරිදි නීති ක්‍රමවේදයන් සකස් කිරීම
- වගකීම් රහිත කසළ බැහැර කිරීම් වැළැක්වීමට පියවර ගැනීම
- සියලුම නාගරික ඉදිකිරීම් නාගරික සංවර්ධ සැලසුම්වලට අනුකූලව සිදු කිරීම නියාමනය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීම
- සියලු නාගරික ඉදිකිරීම්වල දී රථවාහන නැවැත්වීමේ අංගන ඇතිකිරීම ව්‍යාපෘතියේ මූලික කොටසක් ලෙස සැලකීම

1.4 සංවිධාන සටහන

පිටු අංක 37හි දක්වා ඇත.

1.5අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

දෙපාර්තමෙන්තු නොමැත

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතන

- නාගරික සංවර්ධන අධිකාරිය
- නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
- සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
- සෙලෙන්දිවා ආයෝජන සමාගම

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

2021 මූල්‍ය වර්ෂයට අදාලව නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති කිසිවක් නැත.

02. පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ

2.1.1. නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

නාගරික සංවර්ධන අධිකාරිය මගින් මහා භාණ්ඩාගාර අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති

- **පළාත් නවය තුළ ක්‍රියාත්මකකරනු ලබන නගර සංවර්ධන ව්‍යාපෘති**

පළාත් නවය තුළ ක්‍රියාත්මක කරනු ලබන නගර සංවර්ධන ව්‍යාපෘති යටතේ 2021 වර්ෂයේදී ව්‍යාපෘති 57ක් ක්‍රියාත්මක කරන ලදී. නගර සැලසුම්වලට අනුකූලව දිවයිනේ සියලුම පළාත් සඳහා මෙම ව්‍යාපෘති හඳුනාගෙන ඇති අතර මෙහිදී ප්‍රධාන වශයෙන් රථ ගාල්, බස් නැවතුම්පොළ, පොදු වෙළඳපොළ, බහුකාර්යය ගොඩනැගිලි සහ නාගරික උද්‍යාන සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

#	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන -2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
1	කොළඹ	කටුබැද්ද නව වෙළඳපොළ ඉදිකිරීම	166.27	88.27	100%	2,122.17
2		තත්කාලීන ගංවතුර පාලන මධ්‍යස්ථානය	478.00	150.00	89%	
3		බෙලෙක්කඩේ පොළ සංවර්ධනය කිරීම, රත්මලාන	175.00	59.00	100%	
4		බොරලැස්ගමුව බහුකාර්යය ගොඩනැගිල්ල(අදියර II)	422.00	150.00	35%	
5		කෝට්ටේ බලකොටුවේ යෝජිත උද්‍යාන පිවිසුම සහ පහසුකම් මධ්‍යස්ථානය (අදියර I)	30.58	20.00	65%	
		කෝට්ටේ බලකොටුවේ යෝජිතඋද්‍යානපිවිසුමසහ පහසුකම් මධ්‍යස්ථානය (අදියර II)	12.00	10.00	70%	
6		පාවෙන වෙළඳපොළ සහ ඩී.ආර්. විජේවර්ධන මාවත අතර යෝජිත සම්බන්ධකය	32.00	32.00	-	
7		හංවැල්ල බස් නැවතුම්පොළ සංවර්ධනය	85.00	85.00	85%	
8		අවිස්සාවේල්ල පොදු වෙළඳපොළ සංවර්ධනය	142.00	51.00	17%	
9	ගම්පහ	මීනුවන්ගොඩ පොදු වෙළඳපොළ	120.20	52.00	100%	
10		මීනුවන්ගොඩ පොදු වෙළඳපොළ (අදියර II)	150.00	150.00	57%	
11		පේරලන්ද වැව විනෝදාස්වාද උද්‍යානය (අදියර II)	150.00	120.00	100%	
12		ගම්පහ පොදු වෙළඳපොළ සංවර්ධනය (අදියර I)	0.78	0.78	100%	
		ගම්පහ පොදු වෙළඳපොළ සංවර්ධනය (අදියර II)	498.00	95.89	11%	
13		මාකෙවිට ඇවිදින මං තීරුව සංවර්ධනය (අදියර I)	32.00	32.00	100%	
		මාකෙවිට ඇවිදින මං තීරුව සංවර්ධනය (අදියර II)	27.60	27.60	48%	

#	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන -2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
14	කළුතර	පානදුර පොදු වෙළඳපොළ සහ බහුකාර්යය ගොඩනැගිල්ල සංවර්ධනය	406.00	92.00	2%	
15	මහනුවර	ශ්‍රී දළදා මාළිගාවේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	20.00	20.00	10%	
16		හසලක බස් නැවතුම්පොළ (අදියර II)	21.43	21.43	99%	
17		කඩුගන්නාවේ නගර මුහුණත වැඩිදියුණු කිරීම	100.00	75.00	52%	
18		දුම්රිය දෙපාර්තමේන්තුවේ ගම්පොළ කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම (ගම්පොළ දුම්රිය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල ප්‍රතිස්ථාපනය)	41.78	35.78	68%	
19		ගම්පොළ දුම්රිය මාර්ගයට සමාන්තරව අතුරු මාර්ගයක් ඉදිකිරීම (ගම්පොළ අතුරු මාර්ගය සම්බන්ධ කිරීම)	291.37	200.00	23%	
20		ගම්පොළ පරිපාලන සංකීර්ණය (අදියර I)	111.82	60.00	20%	
21		පිළිමතලාව බස් නැවතුම්පොළ සහ මිශ්‍ර සංවර්ධනය (අදියර I) - ඉඩම් සංවර්ධනය	50.00	40.00	-	
22		කටුගස්තොට තොග වෙළඳපොළ (අදියර I) - ඉඩම් සංවර්ධනය	100.00	80.00	-	
23		ගන්නෝරුව මිශ්‍ර සංවර්ධනය	100.00	60.00	-	-එම-
24	නුවරඑළිය	නුවර එළිය මධ්‍යම වෙළඳපොළ (අදියර II)	200.00	120.00	45%	
25		කොටගල තෙත්බිම් පාරිසරික උද්‍යානය සංවර්ධනය (අදියර I)	13.05	13.05	100%	
		කොටගල තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය (අදියර II)	45.86	45.86	55%	
26		ශ්‍රී පාද වන්දනාකරුවන් සඳහා පහසුකම් සංවර්ධනය	15.00	15.00	100%	
27		වලපනේ නගර සංවර්ධනය (අදියර I)	124.00	60.00	23%	
28		නුවරඑළිය, නානු ඔය ඔස්සේ ස්වාභාවික මංපෙත සංවර්ධනය	137.00	50.00	18%	
29		පූඩලූඔය බස් නැවතුම්පොළ සංවර්ධනය (අදියර I)	100.00	50.00	60%	
30		සීතාඑළිය යටිතල පහසුකම් සංවර්ධනය	14.97	14.97	100%	
31	මාතර	නිල්වලා ගං ඉවුර සංවර්ධනය (අදියර III) - යටිතල පහසුකම් සංවර්ධනය	196.00	50.80	100%	
32		අකුරැස්ස බස් නැවතුම්පොළ සංවර්ධනය	155.00	60.00	-	
33		අකුරැස්ස ගංවතුර වැළැක්වීම සඳහා ඇති ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම	125.93	65.00	7%	
34		දෙනියාය යෝජිත රථවාහන නැවතුම්පොළ සංවර්ධනය	10.95	10.95	100%	

#	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන -2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
35	මාතර	දෙයියන්දර බස්නැවතුම් පොළ සහ ඒඅවටඉදිකිරීම	160.00	65.00	-	
36	ගාල්ල	කරාපිටිය මිශ්‍ර සංවර්ධනය - බස් පර්යන්තය (අදියර I සහ II)	50.00	50.00	100%	
37		හෝළුවාගොඩ පාරිසරික කෘෂි උද්‍යානය	222.15	105.73	85%	
38		බෙන්තොට, බලිවල ක්‍රීඩාපිටියසංවර්ධනය	80.00	50.00	70%	
39	හම්බන්තොට	බරවාකුඹුක කුඩා බස් පර්යන්තය	50.27	50.27	100%	
40		වලස්මුල්ල තොග වෙළඳපොළ ඉදිකිරීම	62.79	62.79	95%	
41	යාපනය	යාපනය රෝහල මාර්ගයේ රථවාහන නැවතුම්පොළ සංවර්ධනය (අදියර II)	40.00	35.00	50%	
42	කිළිනොච්චිය	කිළිනොච්චි බස් නැවතුම්පොළෙහි ඉතිරි වැඩ (අදියර II)	63.76	33.76	62%	
43	ත්‍රිකුණාමලය	ගෝමරන්කඩවල යෝජිත පොළ (අදියර II)	16.81	10.00	-	
44	අම්පාර	නින්දවූර් වෙරළ උද්‍යානය ඉදිකිරීම (අදියර I)	80.00	50.00	60%	
45		ඉරක්කමාම් ප්‍රධාන මාර්ගයේ මංසන්ධියේ වීදි ලාම්පු සවි කිරීම	5.00	5.00	40%	-එම-
46	අනුරාධපුරය	තිරප්පනේ භූ දර්ශන වැඩිදියුණු කිරීම	29.80	25.00	38%	
47		සමාධි ප්‍රතිමාව අසළ යෝජිත රථගාල සහ මල් අලෙවිසැල් සංවර්ධනය (අදියර II)	40.00	25.00	87%	
48	කුරුණෑගල	අලව්ව නගරයේ මහජන පොළ සංවර්ධනය	113.00	70.00	65%	
49		කුරුණෑගල වැව රවුම අලංකරණය (අදියර III)	102.15	70.00	54%	
50		කුරුණෑගල, රජපිහිල්ල නාගරික උද්‍යානය ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (අදියර II)	145.00	70.00	22%	
51	පුත්තලම	මාදම්පේ මහජන පොළ සංවර්ධනය	58.80	58.80	100%	
52	කෑගල්ල	වරකාපොළ බස් නැවතුම්පොළ සංවර්ධනය (අදියර I)	143.00	70.00	62%	
53		රඹුක්කන වාණිජ සංකීර්ණය සහ රථවාහන නැවතුම්පොළ - රථගාල (අදියර I)	20.00	20.00	100%	
54	රත්නපුරය	රක්වාන මහජන පොළ සංවර්ධනය	41.30	40.00	95%	
55		කලවාන මහජන පොළ සංවර්ධනය	70.62	40.00	45%	
56		පල්ලෙබැද්ද මහජන පොළ සංවර්ධනය	13.27	13.27	100%	
57	බදුල්ල	දියතලාව සති පොළ සංවර්ධනය (අදියර I)	50.00	40.00	60%	
එකතුව			**6,559.31**	**3,423.00**		

• පසුගාමී කලාපවල නගර සංවර්ධනය

පසුගාමී කලාපවල නගර සංවර්ධනය යටතේ 2020 සිට 2021 දක්වා ව්‍යාපෘති 23ක් සිදු කර ඇත. නගර සැලසුම්වලට අනුකූලව දිවයිනේ පළාත් 8ක් ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘති හඳුනාගෙන ඇති අතර මෙහිදී ප්‍රධාන වශයෙන් රථගාල්, බස් නැවතුම්පොළ, පොදු වෙළඳපොළ, බහුකාර්යය ගොඩනැගිලි සහ නාගරික උද්‍යාන වැනි නාගරික සංවර්ධන ව්‍යාපෘති සිදුකිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

#	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන -2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
1	කොළඹ	හංවැල්ල පොළ සංවර්ධනය	16.88	12.19	100%	552.83
2		පිළියන්දල බස් නැවතුම්පොළ පවිත්‍රාගාරය	8.91	6.40	100%	
3		හොරණ පොළ පවිත්‍රාගාරය	10.26	7.34	100%	
4	ගම්පහ	සියඹලාපේ ඇවිදින මංතීරුව (රථගාල, විවෘත ශරීර සුවතා මධ්‍යස්ථානය, විවෘත ආපනශාලා සහ ආසන පහසුකම්)	18.12	18.12	100%	
5		පේරලන්ද වැව විනෝදාස්වාදඋද්‍යානය (අදියර I)	22.56	22.56	100%	
6	මහනුවර	හතරලියද්ද පොළ භූමියේ පැති බැම්ම ඉදිකිරීම	8.35	6.04	100%	
7	නුවර එළිය	හැටන් දුම්රිය ස්ථානයේ යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම (අදියර V)	111.39	93.41	96%	
8	මාතර	දෙයියන්දර භූදර්ශන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	9.73	9.73	100%	
9	ගාල්ල	බද්දේගම නගර සංවර්ධනය (බස් නැවතුම්පොළ සංවර්ධනය)	22.00	16.11	100%	
10	හම්බන්තොට	වීරකැටිය යෝජිත ආහාර අලෙවිසැල	35.00	35.00	100%	
11		අහුණකොළපැලැස්ස වාණිජ සංකීර්ණය	40.00	30.83	100%	
12		තිස්සමහාරාම බහුකාර්යය ගොඩනැගිල්ල (ඉතිරි වැඩ)	56.98	43.66	100%	
13	යාපනය	වෙල්වැටිතුරෙයි යෝජිත ඔරානි උත්සව භූදර්ශන සංවර්ධනය	19.27	19.27	96%	
14		යාපනය, රෝහල මාර්ගයේ රථගාල සංවර්ධනය (අදියර I)	13.70	13.70	25%	
15	කිළිනොච්චිය	කිළිනොච්චි බස් නැවතුම්පොළෙහි ඉතිරි වැඩ (අදියර I)	17.81	17.81	100%	
16	ත්‍රිකුණාමලය	ගෝමරන්කඩවල යෝජිතපොළ	60.27	48.30	100%	
17		ත්‍රිකුණාමලය, ලන්දේසි බොක්ක ආශ්‍රිත පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම	31.59	31.59	5%	
18	අනුරාධපුරය	අනුරාධපුරය, සේමසිංහ මාවතේ යෝජිත රථගාල සහ භූ දර්ශන ව්‍යාපෘතිය (අදියර II)	11.98	11.98	100%	
19		අනුරාධපුර, මිරිසවැටියේ දාන ශාලාව ඉදිකිරීම (අදියර II)	22.45	22.45	100%	
20		අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාව සඳහා යෝජිත ප්‍රවේශ මාර්ගය ප්‍රතිස්ථාපනය (අදියර I)	40.55	28.38	100%	
21	කුරුණෑගල	කුරුණෑගල රජපිහිල්ල නාගරික උද්‍යානය ප්‍රතිසංවර්ධනය (අදියර I)	23.85	16.69	100%	

#	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන -2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
22	කුරුණෑගල	පොල්පිතිගම යෝජිත කුඩා බස්නැවතුම්පොළ ඉදිකිරීම	22.83	22.83	100%	-එම-
23	බදුල්ල	ලූණුවත්ත පොළ	80.97	65.61	100%	
එකතුව			**705.45**	**600.00**		

- **ඇවිදින මංතීරු සහ සම්බන්ධ පොදු පහසුකම්**

රට හඳන ''සෞභාග්‍යයේ දැක්ම'' රජයේ ප්‍රතිපත්ති රාමුව යටතේ ප්‍රතිපත්ති දහයක් හඳුන්වා දී ඇත. මේ අතරින් තිරසර පාරිසරික සංවර්ධනය යනු ශ්‍රී ලංකාව තුළ යහපත් පරිසරයක් ඇති කිරීම සඳහා බලපාන ප්‍රධාන ප්‍රතිපත්තියයි. තිරසර පරිසර ප්‍රතිපත්තිය මගින් වායුගෝලය, ජෛව විවිධත්වය, ජනාවාස, නගර සහ සාගර සම්පත් ආවරණයවේ. මෙම තිරසර පරිසර ප්‍රතිපත්තිය මගින් කාබන් විමෝචනය, කාර්මික දූෂණය සහ අනෙකුත් වායු දූෂණ මාර්ග පාලනය කිරීම සඳහා මාර්ගෝපදේශ සපයයි. මෙම මාර්ගෝපදේශ යටතේ ශාක රෝපණය, හරිත මාවත්, ඇවිදීමේ මං තීරු, නාගරික වනෝද්‍යාන, අධිවේගී මාර්ග දෙපස තුරුවියන් සහ නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ඇවිදීමේ මංතීරු සමග උද්‍යාන සංවර්ධනය කිරීම හඳුනා ගෙන ඇත. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ බහුවිධ වාණිජ, ජාතික, සහ සම්බන්ධිත නගර සඳහා ඇවිදින මංතීරු 30ක් හඳුනාගෙන ඇත.

#	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන - 2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
1	කොළඹ	මොරටුව, ලුනාව ඇවිදින මංතීරුව සංවර්ධනය	80.69	80.69	75%	720.69
2		මොරටුව ක්‍රීඩාපිටිය හා ඇවිදින මංතීරුව සංවර්ධනය	4.35	4.35	-	
3		පාවෙන වෙළඳපොළ සහිත ප්‍රදේශය වටා පදික මං තීරුව (කොටුව දුම්රියස්ථානයේ සිට මරදාන හන්දිය දක්වා)	52.14	52.14	35%	
4		පාපැදි තීරුව සංවර්ධනය - වරාය නගරයේ සිට නවම් මාවත දක්වා (අදියර I)	86.90	86.90	-	
5		කැස්බෑව වැව වටා ඇවිදින මං තීරුව ඉදිකිරීම	48.43	48.43	80%	
6	ගම්පහ	රදාවාන මහගමසේකර උද්‍යානය සහ ඇවිදින මං තීරුව සංවර්ධනය	6.03	6.03	100%	
7		යක්කල ආයුර්වේද විශ්වවිද්‍යාලය අසළ ඇවිදින මං තීරුව සංවර්ධනය (අදියර I)	80.69	80.69	78%	
8		ගම්පහ හෙනරත්ගොඩ ඇවිදින මං තීරුව සංවර්ධනය(අදියර I)	28.45	28.45	80%	
9		ගම්පහ වොලිබෝල් ක්‍රීඩාපිටිය සහ නාගරික උද්‍යානය (අදියර I)	74.49	66.32	-	
10		ගම්පහ බෞද්ධාලෝක මාවතේ ඇවිදින මං තීරුව සංවර්ධනය	24.83	24.83	52%	

#	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන - 2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
11	ගම්පහ	ගම්පහ, ඔරුතොට ඇවිදින මං තීරුව ප්‍රතිසංවර්ධනය (අදියර I)	68.28	68.28	38%	
12	කළුතර	හොරණ, ඉංගිරිය ඇවිදින මං තීරුව සංවර්ධනය	37.24	37.24	70%	
13	මහනුවර	ගුරුදෙණිය ඇවිදින මංතීරුව සංවර්ධනය	62.07	62.07	95%	
14	නුවර එළිය	නුවර එළිය ග්‍රෙගරි වැව ආශ්‍රිත ඇවිදින මං තීරුව සංවර්ධනය	99.32	99.32	35%	
15	මාතලේ	මාතලේ යෝජිත වී.ටී. නානායක්කාර උද්‍යානයේ ඇවිදින මං තීරුව (අදියර I)	45.34	45.34	75%	
16	මාතර	කඹුරුපිටිය වැව ආශ්‍රිත ඇවිදින මං තීරුව සංවර්ධනය(අදියර I)	62.07	27.00	75%	
17	ගාල්ල	ගාල්ල මොරගොඩ ඇළ ආශ්‍රිත ඇවිදින මං තීරුව සංවර්ධනය	49.66	49.66	68%	
18		බලපිටිය කිරිල්ල ඇළ ආශ්‍රිත ඇවිදින මං තීරුව සංවර්ධනය	49.66	49.66	80%	
19		හෝළුවාගොඩ කෘෂි පාරිසරික උද්‍යානය(අදියර I)	149.84	149.84	90%	
20	හම්බන්තොට	බෙලිඅත්ත අම්පිටියවැව වටා ඇවිදින මං තීරුව සංවර්ධනය (අදියර I)	99.32	99.32	35%	-එම-
21	යාපනය	වේල්ලවේලි ආශ්‍රිත හරිත යටිතල පහසුකම් සංවර්ධනය – පේදුරු තුඩුව ඇවිදින මං තීරුව	80.69	80.69	6%	
22		පේදුරු තුඩුව ඇවිදින මං තීරුවසංවර්ධනය (අදියර I)	68.28	25.00	7%	
23	අම්පාර	අම්පාර පාපැදි සහ ඇවිදින මං තීරු සංවර්ධනය	74.49	74.49	75%	
24	ත්‍රිකුණාමලය	ත්‍රිකුණාමලය ඔර්ස් හිල් මාර්ගයේ ඇවිදින මං තීරුව සංවර්ධනය (අදියර I)	74.49	74.49	80%	
25	මඩකලපුව	මඩකලපුව ඇවිදින මං තීරුව සංවර්ධනය (අදියර I)	52.14	52.14	40%	
26	පොළොන්නරුව	පොළොන්නරුව පොත්ගුල් මාර්ගයේ ඇවිදින මං තීරුව සංවර්ධනය (අදියර I)	35.90	35.90	-	
27	කුරුණෑගල	කුරණෑගල සාරගම වැව සංවර්ධනය	41.57	41.57	100%	
28	රත්නපුර	බලංගොඩ ඇවිදින මං තීරුව සංවර්ධනය	17.75	17.75	100%	
29	කෑගල්ල	රඹුක්කන, පින්නවල ඇවිදින මං තීරුව සංවර්ධනය	55.87	55.87	78%	
30	බදුල්ල	බණ්ඩාරවෙල ඇවිදින මං තීරුව හා ශරීර සුවතා මධ්‍යස්ථානය සංවර්ධනය (අදියර I)	74.49	74.49	75%	
එකතුව			**1,785.47**	**1,698.95**		

- **යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය**

#	ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන - 2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය	
				භෞතික (%)	මූල්‍ය (රු.මිලි.)
1	යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය	2,548.47	450.00	70%	1,074.76
එකතුව		**2,548.47**	**450.00**		

- **බේරේ වැව ප්‍රතිසංස්කරණය සහ ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

#	ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන -2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
1	බේරේ වැව ප්‍රතිසංස්කරණය සහ ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	155.00	150.00	12%	41.88
එකතුව		**155.00**	**150.00**		

- **පෑලියගොඩ මැනිං වෙළඳපොළ ප්‍රතිස්ථාපනය**

#	ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන - 2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය	
				භෞතික (%)	මූල්‍ය (රු.මිලි.)
1	පෑලියගොඩ මැනිං වෙළඳපොළ ප්‍රතිස්ථාපනය	6,994.00	500.00	100%	5,419.97
එකතුව		**6,994.00**	**500.00**		

- **හෝමාගම කලාපයේ මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (තාක්ෂණ නගරය)**

#	ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන -2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය	
				භෞතික (%)	මූල්‍ය (Rs.Mn)
1	කොට්ටාව සිට මාහේනවත්ත දක්වා නව පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම	712.00	200.00	88%	947.11
2	පිටිපන හන්දියේ සිට පාසල් හන්දිය හරහා දම්පේ මාර්ගයේ ශ්‍රී ලංකා ටෙලිකොම් දත්ත මධ්‍යස්ථානය දක්වා (පළල - මීටර් 15.2)	563.00	200.00	5%	
එකතුව		**1,275.00**	**400.00**		

- **සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය**

#	ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන - 2021	2021.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය	
				භෞතික (%)	මූල්‍ය
1	සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය	1,472.41	100.00	47%	4.42
එකතුව		**1,472.41**	**100.00**		

- **නගර අලංකරණ වැඩසටහන**

රට හඳන "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති රාමුව යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අසංවිධානාත්මකව සහ අක්‍රමවත් ලෙස සංවර්ධනය වූ ප්‍රාදේශීය නගර ප්‍රතිසංවර්ධනය කිරීම සඳහා සියක් නගර අලංකරණ වැඩසටහන දියත් කරන ලදී. මෙම වැඩසටහනේ ප්‍රධාන ඉලක්කය වනුයේ දිවයින පුරා මනාව සංවිධානය වූ ආකර්ශනීය සහ ජනතාවට හිතකර ලෙස ජීවත් විය හැකි නගර සංවර්ධනය කිරීමයි.

ආරම්භක පියවරක් ලෙස මෙම වැඩසටහන සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශවලට අයත් සංවර්ධන සැලසුම්, නගර සැලසුම් උපායමාර්ග සහ පොදු විවෘත අවකාශ සහ විනෝදාස්වාද උපායමාර්ග ආවරණය වන කෙටි කාලීන ව්‍යාපෘති කිහිපයක් තෝරා ගෙන ඇත.

වර්තමාන තත්ත්වය සලකා බලන විට ඇතැම් ව්‍යාපෘති මගින් නගර මධ්‍යයේ ඇති අනවසර ව්‍යුහ ඉවත් කිරීම, නගර මධ්‍යයේ ඇති පදික වේදිකා අළුත්වැඩියාව/ ඉදිකිරීම, මාර්ග දෙපස කාණු අළුත්වැඩියාව/ ඉදිකිරීම, නව රථගාල් ඉදිකිරීම, පවතින රථගාල් සංවර්ධනය, අනවසර සහ අලංකාර නොවන දැන්වීම් පුවරු ඉවත් කිරීම හෝ ක්‍රමවත්ව සකස් කිරීම, ගස් සිටුවීම, පොදු ගොඩනැගිලි සහ පොදු බිත්ති ප්‍රතිසංස්කරණය/ නැවත පින්තාරු කිරීම, මාර්ග දිශා පුවරු ඒකාකාරීව සවි කිරීම, කසල එකතු කිරීමේ ස්ථාන සඳහා සුදුසු වැඩසටහන් හඳුන්වා දීම, වීදි ලාම්පු සවි කිරීම, බස් නැවතුම් හා විවේක ප්‍රදේශ ඉදිකිරීම/ අළුත්වැඩියාව, අක්‍රමවත් හා අන්තරාදායක වෙළඳසැල් සහ වාණිජ කටයුතු ඉවත් කිරීම සහ පහසු ස්ථාන ලබාදීම, මාර්ග අළුත්වැඩියාව, පැති බැම් සහ ආරක්ෂක වැටවල් ඉදිකිරීම ආදිය සිදු කරනු ලබයි.

2021 ජූලි මාසයේ දී මුළු දිවයිනම ආවරණය වන පරිදි සුදුසු නගර 100ක් තෝරා ගෙන මෙම වැඩසටහන ආරම්භ කරන ලද අතර එය 2021 දෙසැම්බර් මස අග වන විට අවසන් කිරීමට අපේක්ෂා කරන ලදී.කෙසේ වුවද, සංවර්ධන අවශ්‍යතා මත පදනම්ව වැඩසටහන සඳහා පසුව හඳුනා ගන්නා ලද නගර 21ක් එකතු කිරීමත් සමග සංවර්ධනය කිරීමට අපේක්ෂිත මුළු නගර සංඛ්‍යාව 121ක් දක්වා වර්ධනය විය.එම නගර සියල්ලෙහිම සංවර්ධන කටයුතු සැලසුම් කර ඇති පරිදි 2021 වසර අවසන් වන විට ජනතාවට විවෘත කිරීමට අපේක්ෂා කරන ලදී.සෑම ව්‍යාපෘතියක් සඳහාම රු. මිලි. 20ක ප්‍රතිපාදන වෙන් කරන ලදී.

- **අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු**

දිවයිනේ පළාත් පාලන ආයතන 341 සම්බන්ධයෙන් සහ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දත්ත ගබඩාවක් තිබීමේ අවශ්‍යතාවය අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත.සවිස්තරාත්මක ප්‍රශ්නාවලියක් සකස් කර සියලුම පළාත් පාලන ආයතන වෙත යොමු කරන ලදී.ඒ අනුව, රටෙහි නාගරික සහ අපද්‍රව්‍ය කළමනාකරණ ගැටළු විසඳීම සඳහා ඉතා ප්‍රයෝජනවත් වන පුළුල් දත්ත සමුදායක් හඳුනාගෙන තිබේ.

2022 වසරේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා 2021.08.09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් පහත සඳහන් යෝජනා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

- දිවයින පුරා අපද්‍රව්‍ය කළමනාකරණ උද්‍යාන 10ක් පිහිටුවීම
- කුඩා පරිමාණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන 10ක් පිහිටුවීම
- යාන්ත්‍රික කොම්පෝස්ට් නිෂ්පාදනාගාර 3ක් හෝමාගම, බදුල්ල සහ යාපනය ප්‍රදේශවල ස්ථාපිත කිරීම

- දැනට පවතින කසළ කළමනාකරණ පහසුකම් 125ක් වැඩිදියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම
- අපද්‍රව්‍ය මගින් බලශක්තිය ජනනය කරනු ලබන බලාගාර මගින් බැහැර කරනු ලබන අළු බැහැර කිරීම සඳහා සුදුසු අළු බඳුන් සැලසුම් කිරීම හා ඉදි කිරීම
- පළාත් පාලන ආයතන සඳහා කසල ට්‍රක් රථ 450ක් ලබාදීම
- රෝහල්, කාර්මික, තාක්ෂණික, ඉලෙක්ට්‍රොනික හා ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ක්‍රම ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම

කෙසේ වෙතත්, 2021 සහ 2022 වසර සඳහා අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අමාත්‍යාංශයට මුදල් ප්‍රතිපාදන ලැබී නොමැත. ඒ අනුව, රටේ අපද්‍රව්‍ය කළමනාකරණ අවශ්‍යතා පිළිබඳව පුළුල් අධ්‍යයනයක් සිදු කරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් අමාත්‍යාංශයට නියෝග කර ඇත.

2.1.2. නාගරික සංවර්ධන අධිකාරිය

(i) සංවර්ධන සැලසුම්

- නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2021 වර්ෂයේදී නාගරික සංවර්ධන ප්‍රකාශිත ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් 22 ක් නිමකර ගැසට් කර ඇත. මීට අමතරව "One Stop Shop" සංකල්පය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික වැඩකටයුතු අවසන් කිරීමද, 2021 වර්ෂයේ ලද ජයග්‍රහණයකි.තවද, වර්ෂ1986න් පසු සම්පූර්ණ රෙගුලාසි ගැසට් කිරීම 2021 ජූලි 28 දින සිදුකරන ලදී.

(ii) ව්‍යාපෘති

- 2021 වර්ෂයේ ක්‍රියාත්මක කල ව්‍යාපෘති සඳහා ලබාගත් ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ

- **නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලැබුණු භාණ්ඩාගාර අරමුදල් මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති**

මෙම වැඩසටහන යටතේ නගර සැලසුම්වලට අනුකූලව දිවයිනේ පළාත් 8ක් ආවරණය වන පරිදි රථගාල්, බස් නැවතුම්පොළ, පොදු වෙළෙඳපොළ, බහුකාර්යය ගොඩනැගිලි සහ නාගරික උද්‍යාන ආදී නගර සංවර්ධන ව්‍යාපෘති 44ක් 2020 සිට 2021 තුළ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගෙන ඇත.

#	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන -2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
1	කොළඹ	පිළියන්දල පොදු වෙළඳපොළ	472.00	94.40	5%	1,306.89
2		පිළියන්දල බස් නැවතුම්පොළ (අවසන් බිල්පත ගෙවීම සඳහා පමණි)	183.00	112.00	100%	
3		බොරැල්ල නගර සංවර්ධනය (මූලික අධ්‍යනය)	50.00	20.00	50%	
4		නාරාහේන්පිට නගර සංවර්ධනය (මූලික අධ්‍යනය)	50.00	20.00	50%	
5		කොට්ටාව බස් නැවතුම්පොළ ඉදිකිරීම (අවසන් බිල්පත ගෙවීම සඳහා පමණි)	94.12	53.02	100%	
6		බොරලැස්ගමුව වැව අවට ප්‍රදේශය සංවර්ධනය (අදියර III) (අවසන් බිල්පත ගෙවීම සඳහා පමණි)	80.00	50.13	100%	
7		බොරලැස්ගමුව වැව අවට ප්‍රදේශය සංවර්ධනය (අදියර IV)	94.12	44.00	45%	
8		කොටුව සංවර්ධන ව්‍යාපෘතිය - පදික මංතීරුව (ඩී.ආර්. විජේවර්ධන මාවත සහ පිටකොටුවේ ලංකා විදුලිබල මණ්ඩල ඉඩම)	9.80	9.80	55%	

#	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන -2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
9	කොළඹ	සාලාව - කොස්ගම නගර සංවර්ධනය (අදියර I)	5.00	5.00	100%	-එම-
10		ගාලු මුවදොර අවට හරිත යටිතල පහසුකම් ජාල සැලසුම (අවසන් බිල්පත ගෙවීම සඳහා පමණි)	117.97	60.00	100%	
11		ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ ජාතික සඳුන් උයන ඉදිකිරීම (අදියර I)	157.21	111.33	100%	
12		ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ජාතික සඳුන් උයන ඉදිකිරීම (අදියර II)	192.92	192.92		
13	කොළඹ	කිඹුලාවල නාගරික කෘෂි උද්‍යානය (අදියර I සහ අදියර II) - (අවසන් බිල්පත ගෙවීම සඳහා පමණි)	393.00	128.00	100%	
14		බාලදක්ෂ මාවතේ පදික පහසුකම් මධ්‍යස්ථානය (අවසන් බිල්පත ගෙවීම සඳහා පමණි)	60.00	1.70	100%	
15		මිල්ලෑව නව බන්ධනාගාර ව්‍යාපෘතිය සඳහා නැවත පදිංචි කිරීමේ නිවාස ඉදිකිරීම	130.00	20.00	-	
16		කොළඹ 15, කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දෙවි මැදුරේ භූ දර්ශන සංවර්ධන ව්‍යාපෘතිය	0.80	0.80	-	
17		කොටුවේ මැනිං වෙළඳපොළ පැවති ප්‍රදේශය ප්‍රතිසංවර්ධනය කිරීම	10.00	10.00	100%	
18	ගම්පහ	මීරිගම, මිනීඔලුව විද්‍යාවාස මහ පිරිවෙනේ දහම් පාසල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ (අදියර I)	8.00	8.00	100%	
19		කිරිදිවැල පොදු වැසිකිළිය	9.50	2.50	-	
20		වතුපිටිවල පොදු වැසිකිළිය	9.50	2.00	-	
21		මුතුරාජවෙල තෙත්බිම් සංරක්ෂණ ව්‍යාපෘතියේ මූලික කටයුතු	10.00	10.00	63%	
22	කළුතර	පානදුර වෙරළ උද්‍යානය සංවර්ධනය	59.98	20.63	-	
23	මහනුවර	දිගන, අළුත්වත්ත මිහිඳු ධර්මපීඨයේ බහුකාර්යය ගොඩනැගිල්ල	5.50	5.50	61%	
24		දුනුවිල, මැදමහනුවර සඳගිරි තපෝවන පිරිවෙන් නව ගොඩනැගිල්ල	8.00	8.00	-	
25		අංකුඹුර පොළ සංවර්ධනය	30.00	10.00	-	
26		තලාතුඔය රථගාල සංවර්ධනය	9.50	5.00	-	
27		දවුලගල මහජන පොළ සංවර්ධනය	10.00	10.00	-	
28	නුවර එළිය	නව නගර සංවර්ධන වැඩසටහන - උඩරට සංචාරක මාර්ග	100.00	30.00	10%	
29	මන්නාරම	පල්ලෙමුනෙයි ක්‍රීඩාපිටිය සංවර්ධනය (අදියර II)	46.31	46.31	-	
30	මුලතිව්	මුලතිව් බස් නැවතුම්පොළ අවසන් කිරීම	100.00	20.00	4%	
31	යාපනය	වෙල්වැටිතුරෙයි යෝජිත ඔරානි උත්සව භූ දර්ශන සංවර්ධනය (අදියර II)	29.50	10.00	-	
32	අම්පාර	අම්පාර සති පොළ සංවර්ධනය	173.00	38.00	18%	

#	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (රු.මිලි.)	ප්‍රතිපාදන -2021 (රු.මිලි.)	2021.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (%)	2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලි.)
33	අනුරාධපුරය	අනුරාධපුර නගර අලංකරණ ව්‍යාපෘතිය (බණ්ඩාරනායක මාවත, මෛත්‍රීපාල සේනානායක මාවත සහ හරිස්චන්ද්‍ර මාවතේ යෝජිත භූ දර්ශන සංවර්ධන ව්‍යාපෘති)	64.87	38.00	3%	-එම-
33.1		බණ්ඩාරනායක මාවතේ භූ දර්ශන සංවර්ධන ව්‍යාපෘතිය	13.19	8.00		
33.2		මෛත්‍රීපාල සේනානායක මාවතේ භූ දර්ශන සංවර්ධන ව්‍යාපෘතිය	20.89	15.00		
33.3		හරිස්චන්ද්‍ර මාවතේ භූ දර්ශන සංවර්ධන ව්‍යාපෘතිය	30.79	15.00		
34		අනුරාධපුර පූජා භූමි ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය	177.66	154.96	82%	
34.1		සිහිලැල් මග මං තීරුව ඉදිකිරීම	33.20	33.20	100%	
34.2		ථූපාරාම මං තීරුව ඉදිකිරීම	23.52	23.52	100%	
34.3		රුවන්වැලි මහා සෑයේ සිට ශ්‍රී මහා බෝධිය දක්වා මං තීරුව ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය	32.57	32.57	100%	
34.4		අභයවැව ආශ්‍රිතව මහජනතාව සඳහා ජල උද්‍යානයක් ඉදි කිරීම	34.73	12.03	-	
34.5		රුවන්වැලි මහාසෑයේ වැට ඉදිකිරීම	33.64	33.64	90%	
34.6		අභයගිරිය භූමියේ වීදි ලාම්පු සවි කිරීම	20.00	20.00	100%	
35	රත්නපුරය	ඇහැළියගොඩ, බෙරුවානවත්ත අඩු ආදායම්ලාභීන් යළි නිවාසවල පදිංචි කරවීම (අතුරුමාර්ගය)	112.00	50.00	40%	
36		ඇහැළියගොඩ ඉඩම් සහ යටිතල පහසුකම් සංවර්ධනය	50.00	15.00	3%	
37	කෑගල්ල	කෑගල්ල බස් ඩිපෝව ප්‍රතිස්ථාපනය - පහසුකම් සහ බාහිර වැඩ	400.00	90.00	5%	
38		මීඇලිබොඩ වතුයාය නිවාස ව්‍යාපෘතිය	80.00	20.00	-	
39		රුවන්වැල්ල පොළ සංවර්ධනය	24.00	10.00	-	
40	මොණරාගල	කතරගම පිවිසුම් චතුරස්‍රය සංවර්ධනය	300.89	129.00	22%	
40.1		කතරගම පිවිසුම් චතුරස්‍රය සංවර්ධනය (අදියර III සහ අදියර II)	60.89	29.89	100%	
40.2		වල්ලිමාතා ගං ඉවුරු උද්‍යානය	30.00	15.00	-	
40.3		කතරගම පිවිසුම් චතුරස්‍රය සංවර්ධනය (අදියර III සහ අදියර III)	84.00	48.00	5%	
40.4		කතරගම පිවිසුම් චතුරස්‍රය සංවර්ධනය (අදියර III සහ IV)	96.00	16.11	17%	
40.5		පිවිසුම් චතුරස්‍ර සංවර්ධනය ආශ්‍රිත වැසිකිළි අවහිරවීම් සහ භූ දර්ශනය සකස් කිරීම	30.00	20.00	-	
41		වැල්ලවාය පොළ (අදියර II)	14.00	10.00	-	
42	ගාල්ල	බද්දේගම බස් නැවතුම්පොළ (අදියර III)	10.00	10.00	-	
43	මාතර	දෙයියන්දර බස් නැවතුම්පොළ අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම	20.00	10.00	-	
44	හම්බන්තොට	අඟුණකොළපැලැස්ස වෙළඳපොළ (ඉතිරි වැඩ)	23.00	15.00	-	
එකතුව			**3,937.18**	**1,706.00**		

- **මධ්‍ය ආදායම්ලාභීන් සඳහා නිවාස ව්‍යාපෘති**

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද සමීක්ෂණයකින් කොළඹ නගරය කේන්ද්‍ර කරගනිමින් මධ්‍යම ආදායම්ලාභී නිවාස ඒකක 42,000ක අවශ්‍යතාවය ද හඳුනාගෙන ඇති අතර එමගින් නිවාස සඳහා වන ඉල්ලුම ශීඝ්‍රයෙන් ඉහළ යන බව දැපෙන්නුම් කර ඇත.(මූලාශ්‍රය: නිවාස අවශ්‍යතා තක්සේරුව සහ දත්ත සමීක්ෂණය - 2016)

එකී ඉල්ලුම නාගරික සහ තදාසන්න ප්‍රදේශවල පවතින බැවින් එහි නිවාස සංවර්ධනය හරහා නාගරික ප්‍රදේශ, නාගරික අවකාශ, උපයෝගිතා,පහසුකම් සහපදිංචිකරුවන්ගේ ජීවිතයේ සමස්ත ගුණාත්මකභාවය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිවේ. ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ සියලුම නාගරික ප්‍රදේශ ඉලක්ක කරගනිමින්, නියාමනය කරන ලද 'ඉහළ ඝනත්ව' නිවාස සංවර්ධනය සඳහා පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ හඳුන්වා දීමට අදහස් කරන අතර කොළඹ නගරය, මහ කොළඹ කලාපය, මහනුවර, රත්නපුරය, අනුරාධපුරය සහ අනෙකුත් ප්‍රධාන නාගරික ප්‍රදේශ කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරනු ලැබේ.

#	ව්‍යාපෘතිය	ව්‍යාපෘති කාලය	අරමුදල් ප්‍රභවය	ඇස්තමේන්තුගත මුළු වියදම (රු.මිලි.)	නිවාස ඒකක ගණන	ප්‍රතිපාදන - 2021 (රු.මිලි.)	සමුච්ඡිත මූල්‍ය සහ භෞතික ප්‍රගතිය - 2021.12.31 දක්වා	
							මූල්‍ය (රු.මිලි.)	භෞතික(%)
1	"වියත්පුර" නිවාස යෝජනා ක්‍රමය, වීර මාවත, පන්නිපිටිය	2017 - 2021	නාගරික සංවර්ධන අධිකාරිය	5,838.00	500	2,238.00	3166.00	73%
2	"ග්‍රීන් ආකේඩ්" නිවාස යෝජනාක්‍රමය, කුල සෙවණ වත්ත, කොට්ටාව	2017 - 2021		3,699.00	300	2,059.00	701.00	62%
3	"එලියට් රෙසිඩන්සීස්"නිවාස ව්‍යාපෘතිය, බොරැල්ල	2020-2023		12,637.00	400	3,206.00	42.00	18%
එකතුව				**22,174.00**	**1,200**	**7,503.00**	**3,909.20**	

- **දැරියහැකි මිලට නිවාස ව්‍යාපෘතිය**

ජනතාවගේ සැබෑ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා මධ්‍යම ආදායම් මට්ටමේ නිවාස කාණ්ඩය ප්‍රමාණවත් නොවන බව රජය විසින් අත්දැක ඇති බැවින් ජනතාවගේ ආදායම් මට්ටමට සරිලන පරිදි නිවාස ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා නිවාස අවශ්‍යතාවය සපුරාලීමේ විවිධ වැඩසටහන් හඳුනා ගෙන ඇත.

"රට හදන සෞභාග්‍යයේ දැක්ම"ජාතික ප්‍රතිපත්ති රාමුවේ මග පෙන්වීම සහ රජයේ සහයෝගය ඇතිව නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකී නිවාස අවශ්‍යතාවය සපුරාලීමේ අරමුණ ඇතිව දැරිය හැකි මිලට සපයන නිවාස ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. එමගින්, නිවාස ඒකක 3,000ක ඉදිකිරීම් කටයුතු මේ වන විටත් ආරම්භ කොට ඇති අතර 2021 වසර තුළ ඒකළ, කොට්ටාව - පලතුරුවත්ත, හොරණ - සොරනාවත්ත සහ රත්නපුරය යන ප්‍රදේශවල තවත් නිවාස ඒකක 2,000ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

එම ප්‍රදේශවලට අමතරව විශේෂයෙන්ම ගම්පහ, ගාල්ල, මාතර සහ හම්බන්තොට ඇතුළු සෑම ප්‍රධාන නගරයක් වෙතම මෙම ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පියවර ගනිමින් පවතී.

#	ව්‍යාපෘතිය පිහිටි ස්ථානය	ව්‍යාපෘති කාලය	අරමුදල් ප්‍රභවය	ඇස්තමේන්තු ගත මුළු වියදම (රු.මිලි.)	නිවාස ඒකක ගණන	ප්‍රතිපාදන - 2021 (රු.මිලි.)	සමුච්ඡිත මූල්‍ය සහ භෞතික ප්‍රගතිය - 2021.12.31 දක්වා	
							මූල්‍ය (රු.මිලි.)	භෞතික (%)
1	ඔරුගොඩවත්ත (01 කොටස)	2021 - 2023	නාගරික සංවර්ධන අධිකාරිය/ මහා භාණ්ඩාගාරය	6,080.15	440	1,665.89	1359.00	19%
2	ඔරුගොඩවත්ත (02කොටස)			5,941.69	432	1,608.11	1064.00	16%
3	පැලියගොඩ (01 කොටස)			7,207.19	504	1,537.79	1299.00	7%
4	පැලියගොඩ (02කොටස)			5,529.12	384	1,427.47	952.00	14%
5	ස්ටේඩියම්ගම, බිලූමැන්ඩල්	2021 - 2022		2,896.46	210	654.15	521.00	19%
6	මාකුඹුර, කොට්ටාව	2021 - 2023		4,411.60	314	975.00	774.00	22%
7	මාලඹේ	2021 - 2022		3,637.43	256	798.17	642.00	22%
8	බොරලැස්ගමුව			1,654.37	120	301.85	181.00	12%
9	අනුරාධපුරය			2,277.16	135	577.77	491..00	23%
එකතුව				**39,635.17**	**2,795**	**9,546.20**	**7,284.00**	

(iii) පෞද්ගලික ආයෝජන සහිත ව්‍යාපෘති

- නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2021 වර්ෂයේදී තරඟකාරී ලංසු කැඳවීම මගින් අධිකාරියේ ඉඩම් අක්කර 78 ක් පමණ සංවර්ධන ව්‍යාපෘති 06ක් සඳහා බාහිර ආයෝජකයින් වෙත ලබා දී ඇති අතර, එම ඉඩම් සඳහා ආයෝජකයින් වෙතින් ලබාගැනීමට නියමිත මුදල රු.මි. 5,300.00 ක් පමණ වේ.

(iv) ආයතනයේ මානව සම්පත් කළමනාකරණය

- 2021 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියේ නව සේවක ව්‍යුහය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත් අතර ආයතනික සැලැස්ම අවසාන අදියර දක්වා සකස් කරන ලදී.

(v) ආදායම් උත්පාදනය

- 2021 වර්ෂයේ කොවිඩ් වසංගතය හමුවේ විවිධ දුෂ්කරතා මත වුවද, ආයතනය රු.මි. 297.00 ක ලාභයක් උපයා ඇත.

(vi) විවිධ

- අන්තර් සමාගම් ක්‍රීඩා තරඟ ජයග්‍රහන වශයෙන් රන් පදක්කම් 03ක්, රිදී පදක්කම් 07 ක් හා ලෝකඩ පදක්කම් 05ක් ආයතනය විසින් ලබාගෙන ඇති අතර, කොවිඩ් වසංගතය හමුවේ සේවක සුභසාධනය හා සෞඛ්‍ය ආරක්ෂාව සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

2.1.3. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

- මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව වෙනුවෙන් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් අධිකාරියට ආදායම් උත්පාදනය කිරීම සඳහා ප්‍රවේශයක් ලබාගැනීමට හැකියාව ලැබී ඇති අතර එමගින් අධිකාරියේ ස්වයං අරමුදල පෝෂණය කර ගනිමින් අඩු ආදායම්ලාභීන් සඳහා නිවාස ව්‍යාපෘති සිදුකිරීමේ හැකියාව ලැබී ඇත.

- නව කළමනාකාරීත්වයේ මග පෙන්වීම මත නාගරික ප්‍රදේශයන්හි නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් ලබා ගැනීමට පුළුල් වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී. ඒ අනුව, දීප ව්‍යාප්තව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ 272ක් ඉලක්ක කර ගනිමින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදුකරන ලද සාමාජිය හා ආර්ථික සමීක්ෂණය මගින් නාගරික අඩු පහසුකම් ජනාවාසයන් සම්බන්ධයෙන් දත්ත රැස්කර ගැනීම සඳහා හැකියාව ලැබිණි. එමගින්, ගැටලු පවතින අඩු පහසුකම් ජනාවාසයන් හඳුනාගැනීමේ හැකියාව ලැබී ඇති අතර ඉදිරි වර්ෂ සඳහා ව්‍යාපෘති පෙළගැස්ම වෙනුවෙන් ඉඩම් සංචිතයක් ද හඳුනාගැනීමේ හැකියාව ලැබී ඇත.

- වසර 13ක කාලයක් අධිකාරියේ නිලධාරීන් වෙත ලබාදීමට අපොහොසත් වූ ශ්‍රේණිගත කිරීම් 2021 වර්ෂයේ දී ලබාදීමට හැකිවූ අතර එමගින් අධිකාරියේ නිලධාරීන්හට තම කාර්යයන් තෘප්තිමත්ව සිදුකිරීමේ කාර්යාලීය පරිසරයක් නිර්මාණය කිරීමේ හැකියාව ලැබී ඇත.

- සේවකයින් සඳහා වාර්ෂිකව සිදුකරනු ලැබූ ඇගයීම් ක්‍රියාවලියට අමතරව කාර්තුමය වශයෙන් ද ඇගයීම් සිදුකිරීම මගින් කාර්යක්ෂම කාර්යාලීය පරිසරයක් නිර්මාණය කර ගැනීමේ හැකියාව ලැබී ඇත.

- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට යෝජිත ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ තැපැල් කාර්යාල පරිශ්‍රය පිහිටි ඉඩමේ ඉදිරි වසර 02ක කාලසීමාව තුලදි ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිය තුලින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සඳහා කාර්යාල පරිශ්‍රයක් ලබාදීමට සැලසුම් සකස් කර ඇත. ඒ අනුව, මහා භාණ්ඩාගාරය මගින් පුනරාවර්තන වියදම් සඳහා වෙන් වන ප්‍රතිපාදන තුලින් කාර්යාල පරිශ්‍රය සඳහා ගෙවිය යුතු කුළී මුදල් තවදුරටත් වැය කිරීම අවශ්‍ය නොවනු ඇත.

- 2021 වසරේදී ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘතිවලින් ලබාගත් ප්‍රගතිය

#	නිවාස ව්‍යාපෘතිය	නිවාස ඒකක ගණන	මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලි.)	ලබාගත් ප්‍රගතිය - 2021
1	ලුනාව	356	1,392.33	• මේ වන විට සියලුම නිවාස ඒකක ප්‍රතිලාභීන් වෙත වෙන්කර ඇත
2	'' හයිට්ස්''වැලිසර - වත්තල	408	4,738.68	• රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය (PPP) හරහා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. • පූර්ව නිෂ්කාශන අනුමැතිය ලැබී ඇත. • සංවර්ධන ආයතනය තෝරා ගැනීම අවසන් කොට ඇත. • 2021 දෙසැම්බර් 03 වැනි දින මුල්ගල් තබන ලදී.

#	නිවාස ව්‍යාපෘතිය	නිවාස ඒකක ගණන	මුළු ඇස්තමේන්තු ගත පිරිවැය (රු.මිලි.)	ලබාගත් ප්‍රගතිය - 2021
3	ඔර්වර්ඩ්වත්ත - නිට්ටඹුව	200	3,561.00	• අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ව්‍යාපෘති කමිටුව පිහිටුවා ඇත • සංකල්පීය සැලැස්ම සකස් කර ඇත. • ඉදිරි කටයුතු සිදු කරමින් පවති.
4	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	120	4,110.37	• රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය (PPP) හරහා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. • ව්‍යාපෘති කමිටුව පිහිටුවා ඇති අතර සංකල්පීය සැලසුම සකස් කර ඇත.
5	කඩුවෙල තැපැල් කාර්යාල ඉඩම	400	3,600.00	• නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියවෙත ඉඩම පැවරීමට තැපැල් සේවා දෙපාර්තමේන්තුව කැමැත්ත ලබා දී ඇත.
6	හික්කඩුව තුඩුවේගොඩ (අදියර I සහ II)	අදියර I -32 අදියර II-160	157.9	▪ අදියර 02ක් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලැබී ඇත. ▪ අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා අදියර I ක්‍රියාත්මක කිරීමට නියමිත අතරඉදිකිරීම පිරිවැය මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ද අදියර I ක්‍රියාත්මක කිරීමෙන් පසු නිදහස් වන ඉඩම PPPක්‍රමවේදයයටතේ මධ්‍ය ආදායම්ලාභී ප්‍රජාව සඳහා අදියර II මඟින් ද ක්‍රියත්මක කිරීමට අපේක්ෂිතය.
7	නාවලපිටිය සොයිසාකැලේ	83	408.66	• සමාජ-ආර්ථික සමීක්ෂණ අවසන් කර ඇත. • ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. • 2022 වර්ෂයේ ඒකාබද්ධ අරමුදල් ප්‍රතිපාදන මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2.1.4. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

- 2021 වර්ෂයේදී ගෝලීය කොවිඩ් -19 ව්‍යාප්තිය යටතේ මෙරට ඉදිකිරීම් කර්මාන්තය දැඩි අර්බුදයකට මුහුණ පෑමට සිදු විය. මෙම තත්ත්වය සභාධිපත්‍ය ක්ෂේත්‍රයට බලවත් ලෙස බලපෑ නමුත් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය අර්බුදකාරී තත්ත්වය මනා සේ කළමනාකරණය කර ගනිමින් මූල්‍ය තත්ත්වය ස්ථාවර කර ගැනීමට සමත් විය. ඒ අනුව, රු.මි. 137 කට ආසන්න බදු පසු ලාභයක් වාර්තා කිරීමට සමත්විය. එමෙන්ම, ආදායම් වර්ධන වේගය 2020 ට සාපේක්ෂව 82.5% කි. 2021 වර්ෂයේ ශුද්ධ ලාභය සසඳා බැලීමේදී 2020 ට සාපේක්ෂව 316% ක වර්ධනයක් ළඟා කර ගන්නා ලදී

- මධ්‍ය ආදායම් සභාධිපත්‍ය නිවාස යෝජනා ව්‍යාපෘති සඳහා අයකරන සභාධිපත්‍ය සහතිකපත් ගාස්තු අඩුකිරීමේ ගැසට් පත්‍රය 2021 මැයි මස නිකුත් කිරීමට හැකි විය. එමගින්, මැදි ආදායම්ලාභී සභාධිපත්‍ය නිවාස ලබාගැනීමට අපේක්ෂිත ජනතාවට මූල්‍යමය සහනයක් වනු ඇත

- කොවිඩ් තත්ත්වය හේතුවෙන් සුපුරුදු ලෙස මහජනතාව හා ගැටෙමින් රාජකාරිමය කටයුතු ඉටු කළ නොහැකි පසුබිමක වුවද සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පාරිභෝගික සේවා අංශය, ඉංජිනේරු අංශය හා නීති අංශය සභාධිපත්‍ය දේපළ තුළ ජීවත් වන ජනතාවගේ සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් වන ගැටළු විසඳීම සඳහා සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් මේ සඳහා හැකි උපරිම දායකත්වය දක්වන ලදී. ඒ අනුව, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි 1,385 කින් 809 කට විසඳුම් ලබා දීමට හැකිවිය

- සභාධිපත්‍ය දේපළ හා නීතිය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු ලබා ගැනීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් වන විද්වත් කතිකාවක් ඇති කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ පළ කරනු ලබන වෘත්තියවේදීන් නියෝජනය කරන ප්‍රකාශණ සඳහා සහ සියලු ජාතික පුවත්පත්හි සභාධිපත්‍ය සම්බන්ධයෙන් ලිපි පළ කිරීම

- සභාධිපත්‍ය සේවාවන් ජනතාවට සමීප කිරීම සඳහා මාලිගාවත්ත කළාප කාර්යාලයක් පිහිටුවන ලදී.

2.1.5. සෙලෙන්දිවා අයෝජන සමාගම

- සෙලෙන්දිවා ආයෝජන පුද්ගලික සමාගමේ ආයෝජන උපායමාර්ග හා ප්‍රතිපත්ති රාමුව 2021 මැයි 26 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. සත්කාරක සේවා අංශය වෙනුවෙන් සෙලන්දිවා ලෙෂර් ආයෝජන පුද්ගලික සමාගම2021 ජුනි 20 දින සංස්ථාපනය කරන ලදී.
- වත්කම්කළඹ සංවර්ධනය සඳහා (Asset Portfolio Development) ඇති ශක්‍යතාවය අධ්‍යයනය කර වාර්තාවක් සකස් කිරීම සඳහා තරඟකාරී ටෙන්ඩර් ක්‍රමය අනුව හුවමාරු උපදේශකවරයෙක් (Transaction Advisor) පත්කර ගන්නා ලදී.
- ආදායම් උත්පාදන කාර්යයන් ආරම්භ කරමින්, හිල්ටන් හෝටලයේ චීන ආහාර අවන්හල (Chines Restuarent) 2021 අප්‍රේල් මස සිට මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

2.1.6. කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා රජය, CHECකොළඹ වරාය නගර (පුද්ගලික) සමාගම (CPCC), සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර අත්සන් කරනලද ත්‍රෙපාර්ශවික ගිවිසුමට අනුවශ්‍රී ලංකා රජයවිසින් සියලුම උපයෝගිතා සේවා සහ උපයෝගිතා යටිතල පහසුකම් ප්‍රමාණවත්පරිදිවරාය නගර සීමාව දක්වා සැපයියයුතුය. එම නිසා, වරාය නගර ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, අනෙකුත් අදාළ රජයේ උපයෝගිතා ආයතන සමග සහයෝගයෙන් කොළඹ වරාය නගරයේ සීමාව දක්වා පහත සඳහන් යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සැපයීමසඳහා බැඳී සිටී. තවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධීක්ෂණය හා සම්බන්ධීකරණය යටතේ පහත සඳහන් උපයෝගිතා යටිතල පහසුකම් ව්‍යාපෘති ඉලක්කයටඅනුව සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගෙනඇත.

- ඝන මීටර 35,000ක් වන වරාය නගරයේ දෛනික පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පානීය ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භ කර ඇත. ඒ අනුව, මාලිගාකන්දේ සිට ඉදිකළ ජල සැපයුම් මාර්ගය මේ වන විට අවසන් කර ඇති අතර එලිහවුස් සිට ඉදිකරනු ලබන ජල සැපයුම් මාර්ගය කාලසටහනට අනුව ක්‍රියාත්මක වන අතර එහි ප්‍රගතිය 60%ක් වේ.
- මෙගාවොට් 300ක් වන වරාය නගරයේ විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 100ක වියදමින් ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ විදුලිබල සැපයුම් ව්‍යාපෘතිය මේ වන විට අවසන් කර ඇත.
- ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ කොළඹ මහ නගර සභාව විසින් දක්ෂිණ තාවකාලික මාර්ගය සහ උතුරු ස්ථීර මාර්ගය යන ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක වෙමින් පවතී. ආරම්භයේදී අයවැය අවශ්‍යතාවය පිළිවෙලින් රු.මිලි.862.2ක් සහ රු.මිලි.3,050ක් වශයෙන් ඇස්තමේන්තුකොට ඇත.
- ඇමරිකානු ඩොලර් මිලියන 130ක වටිනාකමෙන් යුත් කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ද කොළඹ මහ නගර සභාව විසින් කාලසටහනට අනුව ක්‍රියාත්මක කෙරේ. මේ වන විට අරුවක්කාළුහි කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ පළමු අදියර අවසන් කොට ඇත.
- ගොඩබිමසිට කොළඹ වරාය නගරය දක්වා ප්‍රධාන මාර්ග ප්‍රවේශ සම්බන්ධතා ඉදි කිරීම මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ඉදිවන ඉදිරියේදී ජාතික මහාමාර්ග ජාලය හා සම්බන්ධ කිරීමට නියමිත ඇමරිකානු ඩොලර් මිලියන 500ක වටිනාකමෙන් යුත් කුළුණු මතින් දිවෙන වරාය පිවිසුම් මාර්ගය මේ වන විට 40%ක ප්‍රගතියක් ළඟාකරගෙන ඇති අතර ඇමරිකානු ඩොලර් මිලියන 600ක වටිනාකමෙන් යුත් කොළඹ දකුණුදෙසින්වරාය නගරයට ප්‍රවේශය සපයනු ලබන සමුද්‍රීය ධාවක දිගුව (උමග) ව්‍යාපෘතිය දැනට සැලසුම් අදියරේපවතී.
- මේ වනවිටමෙම ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව අවසන් කර ඇති අතර එය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස ක්‍රියාත්මක කෙරේ.

ඒ හැරුණු විට, ත්‍රෛපාර්ශවික ගිවිසුමට අනුව ශ්‍රී ලංකා රජය විසින් නිමකළයුතු කොටස් ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පහත පරිදි සිදු කෙරේ:

- ත්‍රෛපාර්ශවික ගිවිසුම අනුව අවසන් පරීක්ෂණ, අනුබද්ධ පරීක්ෂණ සහ ඉදිකිරීම් පරීක්ෂණවලට සහභාගී වීම සහ සාක්ෂිදැරීම.
- ඉඩම් කොටස් සඳහා නිම කිරීමේ සහතික සහ ව්‍යුහයන් සඳහා අනුබද්ධ සහතික නිකුත් කිරීම.
- අදාළ බලපත්‍ර හා අනුමැතීන් ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය (උදා: නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා රේගුව, ආරක්ෂක අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය ආදී)
- උපයෝගිතා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය සංවිධාන සමග සම්බන්ධීකරණය (උදා: මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, කොළඹ මහ නගර සභාව, ශ්‍රී ලංකා ටෙලිකොම්, ලංකා විදුලිබල මණ්ඩලයආදී)
- ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මකභාවය හොඳින් නිරීක්ෂණය කිරීම.

2021.12.31දක්වා නිම කරන ලද:

- අඩි පාලම01 - අවසන්කරඇත
- කෘතිම වෙරළ - අවසන්කරඇත
- මුහුදු ප්‍රදේශය - අවසන්කරඇත
- ජල ගොල්ෆ් ප්‍රදේශය - ජනතාව සඳහා විවෘතකොටඇත
- මුහුදු යාත්‍රා සේවාව - ආරම්භ කොටඇත
- කොළඹ වරාය නගර විශේෂ ආර්ථික කලාපය - පිහිටුවාඇත
- සියලුම ටෙරෙයින් වාහන (ATV) ක්‍රීඩාව ආරම්භ කර ඇත
- බීච් රිසෝර්ට්හි මෙහෙයුමආරම්භ කර ඇත

2.1.7. කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

- අරුවක්කාලු ඝනීපාරක්ෂක කසළ රඳවනය සහ අපදියර ප්‍රතිකර්ම පද්ධතියේ ඉදි කිරීම් අවසන් කිරීම

- අපදියර ප්‍රතිකර්ම පද්ධතියේ මාස 03ක කාලයක් මූලික මෙහෙයුම් කටයුතු සිදු කිරීම

2.2. අභියෝග

2.2.1. නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

- වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්වල ඉදිකිරීම් බිල්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වීම වර්ෂය අවසානය දෙසට නැඹුරු වීම සහ එම බිල්පත් ප්‍රතිපූරණය කිරීමට අවශ්‍ය අක්මුදල් වර්ෂ අවසානයේදී ඌණතාවයකට ලක්වීම
- ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟවීම සහ මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළයාම
- කොවිඩ් 19 වසංගත තත්ත්වය මත බොහෝ වැඩබිම් සැලකිය යුතු කාලයක් වසා තැබීමට සිදුවීම

2.2.2. නාගරික සංවර්ධන අධිකාරිය

- 2021 වර්ෂයේ රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වයහා විවිධ අවස්ථාවලදී රට වසා දැමීම හා ආයතනයේ විවිධ අංශ වසා දැමීම හේතුවෙන් ආයතනයේ ක්‍රියාකාරිත්වය සඳහා බාධා ඇති වූ අතර, එය ව්‍යාපෘති ප්‍රගතිය මන්දගාමී කිරීමට හේතුවිය. මීට අමතරව ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟවීම, හා ඒවයේ මිල අධික ලෙස ඉහල යාමද, සේවක ශ්‍රමය හිඟවීමද, ව්‍යාපෘති සඳහා විශාල බලපෑමක් සිදුකළ අතර එම ව්‍යාපෘති, අදාල මිල ගණන් යටතේ නියමිත කාලය තුල නිම කිරීම අභියෝගයක් විය.

5. දැනට පවතින පුරප්පාඩු පිරවීම සහ අතිරේක මානව සම්පත් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම
6. වෙරළබඩ පළාත් පාලන ආයතන මගින් වෙරළ කලාපයේ කසළ එකතු කිරීමේ නිසි යාන්ත්‍රණයක් නොමැති වීම
7. ධීවර කර්මාන්තය ආශ්‍රිතව සිදුවන පරිසර දූෂණය නිසි ලෙස පාලනය නොකිරීම (ධීවර වරායන්, නැංගුරම් ලෑම, කුඩා යාත්‍රා, කරවල සහ මාළු ටින් කිරීමේ කර්මාන්ත ආශ්‍රිතව)
8. නැව් මගින් ජනනය වන අපද්‍රව්‍ය තෙල් ගබඩා කිරීම සහ බැහැර කිරීමේ පහසුකම

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

මූල්‍යමය අභියෝග :

1. මහා භාණ්ඩාගාර අරමුදල් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් 2021 වර්ෂය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවූ බැවින්, සැලසුම් කරගත් ආකාරයට ජල ගැලීම අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ඒ හේතුවෙන් එකී ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ නිසි පරිදි මහජනතාවට ලබා ගැනීමට නොහැකි වීම
2. පළාත් පාලන ආයතන විසින් ඔවුන්ගේ ඇළ මාර්ග පිරිසිදු කිරීම/ වැඩි දියුණු කිරීම සඳහා ඉල්ලීම් සිදු කරන අවස්ථාවලදී ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය වන මූල්‍යමය ප්‍රතිපාදන නොමැති වීම

මානව සම්පත් අභියෝග :

1. අවශ්‍ය පරිදි මානව සම්පත ලබා ගැනීමට අදාළ අනුමැතින් ලබාදීම ප්‍රමාද වීම හේතුවෙන් කාර්යක්ෂමව හා ඵලදායී සේවාවක් ලබාදීමට බාධා පැමිණීම

2.3. ඉදිරි ඉලක්ක

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

1. 2022 වර්ෂයේ නව වෙරළ ආරක්ෂණ ව්‍යාපෘති 06ක්ද 2021 වර්ෂයේ සිට 2022 වර්ෂයට ක්‍රියාත්මක වන වෙරළ ආරක්ෂක ව්‍යාපෘති 10ක්ද අඛණ්ඩව සිදු කිරීම
2. වෙරළබඩ ජල තත්ත්ව පරීක්ෂා කිරීමේ වැඩසටහන්ද, වෙරළබඩ අධ්‍යයනයන් සහ වෙරළ වැලි පොෂණයට අදාළ වන අධ්‍යයනයන් සිදු කිරීම
3. මන්නාරම, යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි වෙරළ ප්‍රවේශ මාර්ග හඳුනා ගෙන සිතියම් ගත කිරීම
4. ත්‍රිකුණාමල, මුලතිව් සහ යාපනය යන දිස්ත්‍රික්කයන්හි ස්ථීර තුරුලතා තීරය සළකුණු කිරීම
5. යාපනය මනල්කාඩු වැලි වැටිය සහ මඩකලපුව සල්ලතිව් දූපත බලපෑමට ලක්වන ප්‍රදේශ ලෙස ගැසට් කිරීම
6. 2018 වෙරළ කලාප කලමනාකරණ සැලැස්ම සංශෝධනය කිරීම
7. යාපනය සහ අම්පාර දිස්ත්‍රික්කයන්හි වෙරළ උද්‍යානයක්ද වෙරළ නාන ස්ථානයක්ද සංවර්ධනය කිරීම
8. ප්‍රීතිපුර සහ අකුරල වෙරළ උද්‍යාන සංවර්ධනය කිරීම

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

1. සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනත සංශෝධනය කිරීම
2. හඳුනාගත් අන්තර්ජාතික සම්මුතීන් හා ප්‍රඥප්තීන් 8 ක් සඳහා අනුගත වීම හා දේශීය නීති පද්ධතියට ඇතුලත් කිරීම
3. නැව් මගින් සිදුවන තෙල් දූෂණයකදී ක්‍රියා කිරීම සඳහා වූ ජාතික හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාවට නැගීම සඳහා නෞකාවලට පනවන බද්දක් මගින් වූ අරමුදලක් පිහිටුවීම
4. සයුර රකින රැල්ල ස්වේච්ඡා ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් 200ක් ක්‍රියාත්මක කිරීම හා අරමුදලක් පිහිටුවීම
5. හදිසි තෙල් හා රසායන ද්‍රව්‍ය විසිරීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට අදාළ ජාතික පෙරහුරුව පැවැත්වීම
6. ගොවියාපාන සිට වෙරුගල් දක්වා වෙරළාශ්‍රිත පරිසර පැතිකඩ සිතියම්ගත කිරීම
7. කොරල්පර ව.මී. 800 ක් හා කඩොලාන අක්කර 8ක් ප්‍රතිස්ථාපනය කිරීම
8. Glo-Litter, Green Voyage, Glo-Fouling ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

9. නීල සම්මාන ප්‍රධානෝත්සවය හා සමුද්‍රීය පර්යේෂණ සම්මන්ත්‍රණය පැවැත්වීම
10. MEPA academy ශිල්ප ආයතන මගින් පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම
11. නීල අර්ථිකයට අදාල මාර්ගගත සැලසුම සැකසීම
12. එමවී එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර අදාල ඉදිරි ක්‍රියාමාර්ග
    - වෙරළ සම්පූර්ණයෙන්ම පිරිසිදු කර අවසන් කිරීම
    - විශේෂඥ කමිටුව හරහා පාරිසරික හානි තක්සේරු අවසාන වාර්තාව සකස් කිරීම
    - අපරාධ නීතිය යටතේ හා සිවිල් නීතිය යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීම
    - වන්දි ලබාගැනීම : මෙහෙයුම් වියදම් සියල්ල ප්‍රතිපූරණය කිරීම හා පාරිසරික හානිය ප්‍රතිපූරණය කිරීම
    - මුහුදු පත්ලේ පවතින අපද්‍රව්‍ය, කන්ටේනර් බහාලුම් හා හානි වූ නෞකාව හා එහි සියලු කොටස් ඉවත් කිරීම
    - සමුද්‍රීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම
    - වන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් දූෂණ සිද්ධි විමර්ශනයට - CLS (France) සහයෝගිතාව ලබාගැනීම

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

1. දැනට වැඩ කටයුතු ආරම්භ කර ඇති වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතින්හි හැකි ඉක්මනින් වැඩ අවසන් කර එහි ප්‍රතිලාභ ජනතාව වෙත ලබා දීම
    - වේරස්ගහ ව්‍යාපෘතිය
    - ඔලියමුල්ල ව්‍යාපෘතිය
    - කොලොන්නාව ව්‍යාපෘතිය
2. දැනට සැලසුම් හා නිර්මාණ කටයුතු සිදුකරමින් පවතින වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතින්හි අදාළ සැලසුම් හා නිර්මාණ හැකි ඉක්මනින් වැඩ අවසන් කර ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම
    - මාදිවෙල දකුණු හැරවුම් ව්‍යාපෘතිය
    - මුදුන් ඇල ව්‍යාපෘතිය
    - රත්මලාන - මොරටුව ව්‍යාපෘතිය
    - පිළියන්දල ව්‍යාපෘතිය
3. දැනට නිර්මාණ කටයුතු සිදුකරන කැලණි ගඟ ආශ්‍රිත කළු පාලම අසල යෝජිත පොම්පාගාරයෙහි නිර්මාණ කටයුතු අවසන් කිරීම
4. 2021 වර්ෂය තුලදී වැඩ කටයුතු අවසන් කර ඇති කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියෙහි නඩත්තු කටයුතු ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් පවත්වාගෙන යෑම

.....

ප්‍රධාන ගිණුන්දීමේ නිලධාරී:
නම :
තනතුර :
දිනය : 2022.02.25

සිරිනිමල් පෙරේරා
ලේකම්
නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා
ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
17 වන මහල, .සුහුරුපාය, බත්තරමුල්ල

3. පරිච්ඡේදය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 2021.07.07 දිනැති 2235/45 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කරන ලද අතර 2021 වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශය වෙත වැය ශීර්ෂයක් වෙන්කර දීමක් සිදු නොවීය. අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ BD/ID/123/12/2021 දරණ ලිපිය මගින් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද සියළු සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අයත් වැය ශීර්ෂ අංක 411 යටතේ වෙන් කල බව දැනුම් දී ඇති අතර එම රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021හි වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ සමස්ථ මූල්‍ය කාර්යසාධනයද ඇතුලත් කර ඇත.

කරුණාකර ඇමුණුම අංක 01 සහ 02 බලන්න.

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුවට		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන (රු.)		භාණ්ඩාගාර වාර්තා අනුව වියදම (රු.)	අතැති බිල්පත් 2021.12.31 (රු.)	මුළු වියදම අතැති බිල්පත් සමග (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය				
පුනරාවර්තන						
ප්‍රාග්ධන						

3.7 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

#	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	ලැබුණු ප්‍රතිපාදනවලින් උපයෝගී කරගත් ප්‍රමාණය (% ලෙස)
			මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය (රු.)	2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

04. පරිච්ඡේදය

4. කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

#	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
1	සංරක්ෂණය කරන ලද වෙරළ තීරය	187%	-	-
2	නිකසල සාගර හා වෙරළ සංවර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාවය	-	75%	-
3	සංවේදී සමුද්‍ර පරිසර සංරක්ෂණය හා ප්‍රතිස්ථාපනය	-	-	67%

05.පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු :

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
13.දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම	13.1. සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තුදීමේ සහ එවැනි තත්ත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම	සංරක්ෂණය කරන ලද වෙරළ තීරය			187%
14. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය	14.1 2025 වනවිට සමුද්‍රීය අපද්‍රව්‍ය සහ පෝෂක දූෂණය වීම ද ඇතුළුව විශේෂයෙන්ම ගොඩබිම පදනම් කරගත් ක්‍රියාකාරකම් මගින් සිදුවන සියලුම ආකාරයේ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිව යුතු මට්ටමින් අවම කිරීම	නිකසල සාගර හා වෙරළ සංවර්ධන වැඩසටහන් දියත් කිරීමේ කාර්යක්ෂමතාවය			75%
		සංවේදී සමුද්‍ර පරිසර සංරක්ෂණය හා ප්‍රතිස්ථාපනය		67%	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අංශය	ඉලක්ක	ජයග්‍රහණ	අභියෝග
වෙරළ සංරක්ෂණය	13.1. සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තුදීමේ සහ එවැනි තත්ත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම	**<u>2021 වර්ෂය තුල නිමකරන ලද ව්‍යාපෘති</u>** • වෙරළ ආරක්ෂක ව්‍යාපෘති - 21 • වෙරළ ජල තත්ත්ව පරීක්ෂා - 4 • කොග්ගල වෙරළ උද්‍යානය සංවර්ධනය • මඩකලපුව, ත්‍රිකුණාමලය, අම්පාර හා කොළඹ දිස්ත්‍රික්ක වල වෙරළ ප්‍රවේශ මාර්ග සිතියම් ගත කිරීම • පුත්තලම හා මඩකලපුව දිස්ත්‍රික්ක තුල ස්ථීර තුරුලතා තීරය සලකුණු කිරීම අවසන් කිරීම	වෙරළ ආරක්ෂණ ව්‍යාපෘති සඳහා යන්ත්‍රෝපකරණ සපයා ගැනීම මෙන්ම පුපුරණ ද්‍රව්‍ය හිඟවීම නිසා කළුගල් සැපයුම පිළිබඳ ගැටළු ඇති වීම හේතුවෙන් ඇතැම් ව්‍යාපෘතිවල ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වීම

අංශය	ඉලක්ක	ජයග්‍රහණ	අභියෝග
සමුද්‍රීය පරිසර ආරක්ෂණය	14.1 2025 වනවිට සමුද්‍රීය අපද්‍රව්‍ය සහ පෝෂක දූෂණය වීම ද ඇතුළුව විශේෂයෙන්ම ගොඩබිම පදනම් කරගත් ක්‍රියාකාරකම් මගින් සිදුවන සියලුම ආකාරයේ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු මට්ටමින් අවම කිරීම	**<u>ශ්‍රී ලංකා මුහුදු කලාපයේ සිදු වූ නෞකා අනතුරු මගින් සිදු වූ හානි අවම කර ගැනීම හා දඩ මුදල් අයකර ගැනීම</u>** • 2021.01.23 දින - එම්වී යුරෝසන් (කුඩා රාවණා කොරල්පරය ආශ්‍රිතව) • 2021.05.20 දින - එම්වී එක්ස්ප්‍රස් පර්ල් • 2021.06.08 දින - සපුගස්කන්ද තෙල් පිරිපහදුව • 2021.07.12 දින - එම්වී විශ්වා එක්ටා නෞකා අනතුර (හම්බන්කොට) • 2021.07.21 දින - එම්වී විනාලයිනිස් බ්‍රේව් (කොළඹ) • 2021.08.21 දින - එම්වී එක්ස්ප්‍රස් යමුනා • එම්ටී නිව් ඩයමන් නොෞකා අනතුර MEPA අභ්‍යාස ආයතනය සහ SDG 14+ ලේකම් කාර්යාලය පිහිටුවීම කොරල්පර ව.මී. 200ක් හා කඩොලාන අක්කර 5ක් ප්‍රතිස්ථාපනය	• වෙරළබඩ දිස්ත්‍රික්කවල ස්ථාපිත රෝහල් මගින් සායනික අපජලය වෙරළබඩ ප්‍රදේශවලට අනිසි ලෙස බැහැර කිරීම. (ත්‍රිකුණාමලය රෝහල, යාපනය ශික්ෂණ රෝහල, මාතර මහ රෝහල, තංගල්ල මහ රෝහල) • කොළඹ මහනගර සභාව විසින් දිගු දුර නල මගින් පිරිපහදු නොකළ අපද්‍රව්‍ය සහ මළ අපද්‍රව්‍ය මුහුදට බැහැර කිරීම • වෙරළබඩ පළාත් පාලන ආයතන මගින් වෙරළ කලාපයේ කසළ එකතු කිරීමේ නිසි යාන්ත්‍රණයක් නොමැති වීම

6. පරිච්ඡේදය

6.මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

#	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)	
ජ්‍යෙෂ්ඨ	14	07	07	ඇබෑර්තු
තෘතීයික	01	-	01	ඇබෑර්තු
ද්විතියික	54	26	28	ඇබෑර්තු
ප්‍රාථමික	17	05	12	ඇබෑර්තු

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය : <u>මානව සම්පත් හිඟය</u>

මානව සම්පත් හිඟය නිසා කාර්යක්ෂමතාවය අඩුවේ. රාජකාරී කටයුතු නිසි වේලාවට සිදු කිරීමට ප්‍රමාද වේ. තව ද විවිධ පුද්ගලයන්ගේ අදහස් හා නව යෝජනා දැනගැනීමට හැකියාවක් නොමැති වීම නිසා ආයතනික වශයෙන් අරමුණු හා අභිමතාර්ථයන් සඵල කරගැනීමේ දී පසුගාමී බවක් දක්නට ලැබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

#	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු' 000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	2021 සංවර්ධන නිලධාරීන් හා උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන	45	දවස් 05	-	-	දේශීය	රාජ්‍ය සේවයට අදාළ කාර්යාල ක්‍රම, විනය, නීති, ව්‍යවස්ථා, ආයතනික සංග්‍රහ, අන්තර්පුද්ගල සබඳතා, මූදල් රෙගුලාසි, පරිපාලන නීති

ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායකවන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

නවක නිළධාරීන්හට රාජකාරී විෂයන් පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමට හැකිවීම මගින් කාර්ය මණ්ඩලයේ දැනුම හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ හැකියාව ලැබීම සහ දැනුම ආකල්ප කුසලතා වැඩිදියුණු කරගැනීම මගින් කාර්යසාධනය කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කරනු ලබයි.

07. පරිච්ඡේදය

7. අනුකූලතා වාර්තාව

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කරපවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියලු මාසික ගිණුම් සාරාංශ (CIAS) පිළියෙළ කර නියමිත දිනට මහාභාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ.	2021 වර්ෂයේ මෙම අමාත්‍යාංශය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල නොවේ.	2021 වර්ෂයේ මෙම අමාත්‍යාංශය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
3 .2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල නොවේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දීම	අනුකූල නොවේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම			
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			2022 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන අංශයේ වැඩකටයුතු ක්‍රියාත්මක වේ.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම			2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද්දේ 2021.07.07 වන දිනදීය. ප්‍රධාන අභ්‍යන්තර විගණක වැඩ භාරගනු ලැබුවේ 2021.11.01 දිනදීය. එබැවින් අභ්‍යන්තර විගණන අංශය 2022 වර්ෂයේ සිය වැඩ කටයුතු ආරම්භ කරන ලදී.	2022 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන අංශයේ වැඩ කටයුතු ක්‍රියාත්මක වේ
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම			
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේනතුවට ඉදිරිපත් කර තිබීම			
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම			

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම			
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම			
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ.		

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රඟෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
11.2	මු.රෙ 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම			
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම			
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම			
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
13.2	පොදු තැන්පතු සඳහාවන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
14	**අග්‍රිම ගිණුම්**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම			
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම			
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම			
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකොට තිබීම			

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම			
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම			
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා එළ කිරීමට පහසුකම් සලසා තිබීම			
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම			
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම			

#	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම්කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම			
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල නොවේ.	2021වර්ෂය සඳහා වැය ශීර්ෂයක් වෙන් කර නොමැත.	2022 වර්ෂය සිට පවත්වා ගැනේ.

වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සංවිධාන සටහන



ජාතික අයවැය දෙපාර්තමේන්තුව
தேசிய வரவு செலவுத்திட்ட திணைக்களம்
DEPARTMENT OF NATIONAL BUDGET

මුදල් අමාත්‍යාංශය நிதி அமைச்சு Ministry of Finance

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව பொதுத்திறைசேரி, கொழும்பு 01, இலங்கை General Treasury, Colombo 01, Sri Lanka

මගේ අංකය எனது இல. My No.	BD/ID/123/12/2021	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி. Date	2021.08.

ලේකම්
නාගරික සංවර්ධන අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

ලේකම්
වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

2021.07.07 දිනැති අංක **2235/45** දරණ ගැසට් පත්‍රය අනුව අමාත්‍යාංශ වල විෂයයන් හා කාර්යයන් සංශෝධනය වීම අනුව වසරේ ඉදිරි කාලයේදී වියදම් දැරීම හා ගිණුම්ගත කිරීම

ඉහත ගැසට් පත්‍රයට අනුව එතෙක් නාගරික සංවර්ධන අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති විෂයයන් හා කාර්යයන් කිහිපයක් එම අමාත්‍යාංශයෙන් ඉවත් කර අලුතෙන් ඇති කරන ලද වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇත. එම නව අමාත්‍යාංශය වෙත නව වැය ශීර්ෂ අංකයන් ඇති කර ඒ යටතේ අයවැය ප්‍රතිපාදන ලබා දෙන තෙක් වැය ශීර්ෂ 411 යටතේ ම නව අමාත්‍යාංශය සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව නව අමාත්‍යවරයාගේ හා ඔහුගේ කාර්ය මණ්ඩලයට අදාල වියදම් 411-01-01 ව්‍යාපෘතිය මඟින් හා නව අමාත්‍යාංශ කාර්යාලයට අදාල වියදම් 411-1-2 ව්‍යාපෘතිය මඟින් ලබා දීමට කටයුතු කරනු ඇත. එසේ කිරීමට හැකිවන පරිදි අවශ්‍ය ප්‍රතිපාදන පිළිබඳ ඇස්තමේන්තුවක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත දැනුම් දෙමි. එලෙස ප්‍රතිපාදන ලබාදෙන තුරු අමාත්‍යාංශ ද්විත්වයෙහි නිළධාරීන් සාකච්ඡා කර පවතින ප්‍රතිපාදන තුලින් වියදම් දැරීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස්කරනු ලෙස වැඩි දුරටත් දැනුම් දෙමි.

04. මීට අමතරව පහත සඳහන් වැය විෂයන් යටතේ 2021 වර්ෂයට වෙන්කර ඇති ප්‍රතිපාදන වල ඉතිරිය නව අමාත්‍යාංශයේ කටයුතු සඳහා යොදාගත හැකිය.

411-2- 3-29-1503
411-2-3-2-2201
411-2-3-18-2201
411-2-3-8-2506
411-2-3-11-2506

මෙහිලා ඔබගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

එම්. අනෝමා නන්දනී
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

අ/කලේ: සුඩ නිලුක්ෂාන්
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්: 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිනුම් දෙපාර්තමේන්තුව
2. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
3. විගනාකාධිපති - . විගණකාධිපති දෙපාර්තමේන්තුව

වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය
පාලන අංශය
23 FEB 2022
ලේකම් මණ්ඩල, සෙත්සිරිපාය, දෙවන අදියර
බත්තරමුල්ල.

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

அரச நிதித் திணைக்களம்

DEPARTMENT OF PUBLIC FINANCE

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம்
Director General
Tel. 94-11-2484614
Fax. 94-11-2431458
Email: dgpf@pfd.treasury.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office
Tel. 94-11-2484637
Fax. 94-11-2431458

பொதுத் திறைசேரி
நிதி அமைச்சு
செயலகம், கொழும்பு 01, இலங்கை.

මහා භාණ්ඩාගාරය
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.

General Treasury
Ministry of Finance
The Secretariat, Colombo-01, Sri Lanka.

Website: www.treasury.gov.lk
Gen. E-mail: info@pfd.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PFD/RED/REG/CRC/GEN/2022

ඔබේ අංකය / உமது இல / Your No: SMCC/P&M/APR/(2021)/2022

දිනය / திகதி / Date: 2022.02.17

ලේකම්
වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව-2021

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2022.01.20 දිනැති ලිපිය හා බැඳේ.

02. වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙළ කිරීම හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි ඡේද අංක 10 සහ 12 හි විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. කෙසේ වුවද, ඔබගේ ලිපිය අනුව 2021 වර්ෂය සඳහා වැය ශීර්ෂ අංක 411- නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අනුමත ප්‍රතිපාදනවලින් ඔබ අමාත්‍යාංශයේ සියළු සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වෙන්කර ඇති බව නිරීක්ෂණය කරමි. ඒ අනුව, ඔබ අමාත්‍යාංශය විසින් එම ප්‍රතිපාදනවලට එරෙහිව කරන ලද වියදම් ද ඇතුළත්ව නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් උක්ත චක්‍රලේඛයෙහි 10 ඡේදය අනුව 2021 වර්ෂය වෙනුවෙන් වූ කාර්යසාධන වාර්තාව සකස් කර ඇතැයි අදහස් කරමි.

02. ඒ අනුව, රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 12 ඡේදය යටතේ නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන 2021 කාර්යසාධන වාර්තාව සඳහා වැය ශීර්ෂ අංක 411 යටතේ ඔබ අමාත්‍යාංශයට වෙන් කළ ප්‍රතිපාදන සම්බන්ධ කාර්යසාධනය ද ඇතුළත් කිරීම සුදුසු බව නිරීක්ෂණය කරමි.

03. 2022 වර්ෂයට වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වැය ශීර්ෂ අංක 443 යටතේ අයවැය ප්‍රතිපාදන අනුමත කර ඇති බැවින් 2022 වර්ෂය සඳහා උක්ත චක්‍රලේඛය අනුව ඔබගේ වැය ශීර්ෂ අංකය වෙනුවෙන් අවසාන ගිණුම් සකස් කිරීම හා කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීමට හැකි බව ද නිරීක්ෂණය කරමි.

ජේ.සී. වැලිගමගේ
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1) ලේකම්, නාගරික සංවර්ධන අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය — කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
2) විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
3) පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්, පාර්ලිමේන්තු සභානායක කාර්යාලය — කරු.දැ.ගැ.ස
4) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
5) අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එච්යූඩ්/ඩ්/එස්එම්යූඩ්/එෆ්ඒ/2021/02

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී

නාගරික සංවර්ධන,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

Samantha
CFC
31/6.

අයි.ඩී.එස්.වසන්තා
ජේෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

අයි.ඩී.එස්. වසන්තා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

C.F.O.

පිටපත- අධ්‍යක්ෂ ජනරාල් - ගිණුම් දෙපාර්තමේන්තුව

02 JUN 2022 (3)

02 JUN 2022

31 MAY 2022

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එවියුඩි/ඩී/එස්එමියුඩි/එෆ්ඒ/2021/02

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරි

නාගරික සංවර්ධන,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

නාගරික සංවර්ධන,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක විගණන කළමනාකරණ වාර්තාව නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතු ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සෑකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(අ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

මූලධන වියදම්

අමාත්‍යාංශයේ වැයවිෂයය අංක 411-2-3-2506 (යටිතල පහසුකම් සංවර්ධනය) යටතේ සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් අමාත්‍යාංශයේ විවිධ අංශ යටතේ ක්‍රියාත්මක කරන අතර එම වැඩ ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ලබාදෙන වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් ගෙවීම් සෘජුවම එක් එක් උප වැය විෂයයන් හර කරන බව නිරීක්ෂණය විය. එබැවින් කොන්ත්‍රාත්කරුවන් අදාල කාර්යයන් ආවරණය කර අමාත්‍යාංශයට එය වියදමක් වීමට ප්‍රථම එම මුදල අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදමක් බවට ගිණුම්ගතව තිබු බැවින් 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක උප සංවර්ධන ව්‍යාපෘති 50 ක් සඳහා ලබාදෙන ලද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.848,318,879 කින් 2021 දෙසැම්බර් 31 දිනට අඩුකර නොගත් රු.649,973,649 ක් 2021 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශයේ දක්වනවා වෙනුවට වියදමක් ලෙස ගිණුම් ගතව් තිබුණි. ගිණුම් වර්ෂය අවසන් වන විට නොපියවූ අත්තිකාරම් වටිනාකම් ගිණුම් වාර්තාවල, ලැබිය යුතු මුදලක් ලෙස හෙලිදරවු කිරීමේ පහසුකම් භාණ්ඩාගාරය විසින් හදුන්වාදී නොමැති බැවින් එලෙස හෙලිදරවු කිරීමට නොහැකිවී තිබුණු බව පිලිතුරු ලෙස දක්වා තිබුණි. මෙම මුදල හදුනාගත හැකි පරිදි කොන්ත්‍රාත් ගෙවීම් ලේඛනයක්ද පවත්වා නොතිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

අමාත්‍යාංශයේ වාහන ලැයිස්තුව අනුව අමාත්‍යාංශය සතු වාහන 19 ක් පැවති අතර ඒවායෙහි තක්සේරු වටිනාකම වන රු.153,565,500 ගිණුම්ගත කිරීමේදී රු.4,495,500 ක් අඩුවෙන් සටහන් කර තිබුණු බව නිරීක්ෂණය විය.

1.6.2.2 ප්‍රාග්ධන වියදම් තුලින් ජනිත වූ වත්කම් හඳුනා නොගැනීම

අමාත්‍යාංශය විසින්, වෙනත් මූලධන වියදම් යටතේ ඇති යටිතල පහසුකම් සංවර්ධන වැයවිෂයය (2506) මගින් 2021 වර්ෂය තුල රු.8,280,182,549 ක් සංවර්ධන කටයුතු සඳහා වැයකර තිබුණි. නමුත් එම ප්‍රාග්ධන වියදම දැරීම තුලින් පැන නැගුණු වත්කම් හෝ කෙරීගෙන යන වැඩ පිළිබඳව හඳුනාගෙන හෙලිදරව් කිරීම සඳහා මහා භාණ්ඩාගාරය මගින් හඳුන්වා දී ඇති ගිණුම්කරණ පද්ධතිය මගින් පහසුකම් සපයා නොතිබීම හේතුවෙන් ඒවා පිළිබඳව ගිණුම් ප්‍රකාශන තුල හෙලිදරව් වී නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

අ) ඇස්තමේන්තු ප්‍රතිපාදනය හා තත්‍ය වියදම අතර විචලනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන්, නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවත් එසේ කටයුතු කර නොතිබූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(i) පුනරාවර්ථන වැය විෂයයන් 04 ක් සඳහා එකතුව රු.1,800,000 ක ප්‍රතිපාදන සහ ප්‍රාග්ධන වැයවිෂයයන් 03 ක් සඳහා එකතුව රු.300,750,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි.

(ii) පරිපුරක ඇස්තමේන්තු බල අංක 663 මඟින් වැය විෂයය අංක 411-02-03-2-2509 ඔලියමුල්ල හා කොලොන්නාව ගංවතුර පාලන ව්‍යාපෘතිවල වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන රු.300,000,000 ක් අදාල කාර්යය සඳහා යොදවා නොමැතිව සම්පූර්ණ මූදලම ඉතිරිකර තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) මු.රේ.66 යටතේ වැයවිෂයයන් 03ක් සඳහා මාරුකර තිබූ රු.718,500,000 ක සම්පූර්ණ මුදලම ඉතිරි වී තිබුණි.

(iv) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය මඟින් වැය විෂයයන් 09 ක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු සියයට 13 සිට සියයට 100 දක්වා ප්‍රතිශතයකින් කර තිබූ එකතුව රු. 1,682,316,307 ක ඉතිරිවීම් වලට හේතු පැහැදිලි කිරීම් පිලිගතහැකි තත්වයක නොතිබුණි.

(v) පුනරාවර්ථන වැයවිෂයයන් 07 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු රු.7,060,000 ක සහ ප්‍රාග්ධන වැය විෂයයන් 16 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු රු.12,504,350,000 ක මුදලින්, එක් එක් වැය විෂයයේ ප්‍රතිපාදන වලින් 20% ත් 96% ත් අතර පරාසයක වන ලෙස පුනරාවර්ථන ප්‍රතිපාදනයෙන් එකතුව රු.2,831,790 ක් හා ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් එකතුව රු.3,605,035,367 ක් වන ලෙස සමස්ථ ඉතිරිය රු.3,607,867,157 ක් වී තිබුණි.

2.2 බැරකම් හා බැදීම් වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශනවල සටහන III හි බැදීම් හා බැරකම් ප්‍රකාශයේ වැයවිෂයයන් 04 කට අදාල රු.8,041,683 ක බැරකම් දක්වා නොතිබුණි.

2.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශය තුල ඇතුලත්ව තිබුණු වාහන 03 කට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් මු.රෙ 104(4) ප්‍රකාරව අවසන් පරීක්ෂණ පවත්වා වගකිවයුත්තන් නිෂ්චය කර නොතිබුණු අතර එක් වාහනයක් 2021 සැප්තැම්බර් 21 දින අනතුරු සිදුවී තිබුණු නමුත් සිදු වුණු අලාභය (අලුත්වැඩියා වියදම) තක්සේරු කර එම අලාභය පියවා ගැනීමට අනතුර සිදුවී මාස 08 ක් ගත වුවද කටයුතු කර නොතිබුණි.

ජේෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට